# ශක්තිය

ප්‍රගතියේ ජනහඬ කැටුව එන පුවත්පත

තැපැල් කාර්යාලයේදී ලියාපදිංචි කරන ලදී QD/43NEWS/2017

වෙළුම 15 | කලාපය 03 | 2017 ජූලි | මිල රු.20/-

## පළාත් සභා ඡන්දයටත් කණකොක් හඬ

ඉදිරි ඔක්තෝබර් මස දින නියම කිරීමට නියමිත පළාත් 3ක ඡන්ද විමසීම කල්දැමීමට අමාත්‍ය මණ්ඩලය තුල සාකච්ඡා වී තිබේ. එයට හේතු ලෙස අගමැතිවරයා දක්වා ඇත්තේ පළාත් සභා ඡන්ද සියල්ල එකවර තැබීමටත්, නව ඡන්ද ක්‍රමය යටතේ කොට්ඨාශ සීමානිර්ණය සිදු කළ යුතු බවත්ය. මේ පිළිබඳව පළාත් සභා පනතට සංශෝධන ගෙනඒමට ආණ්ඩුව සූදානම් වන අතර එයට විරුද්ධව ඒකාබද්ධ විපක්ෂය ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු දැක්වීමටත් විරෝධතා ක්‍රියාවලිය දිගට රටපුරා ගෙනයාමටත් තීරණය කර ඇති බව සැලයි.



# ඡන්දයෙන්, වැඩ වර්ජනයෙන් ආණ්ඩුව කපෝතියි

## ඡන්දය කල් දැමීමට "කුමන්ත්‍රණයක්"!

**සමාජ, ආර්ථික දේශපාලන අර්බුදය හමුවේ රටේ සෑම ක්ෂේත්‍රයක් තුලම ව්‍යාකූල තත්වයක් නිර්මාණය වී රට හානියට පත්වෙමින් තිබෙන අතර, ආපදා තත්වය, ඩෙංගු හා කැළි කසළ ප්‍රශ්ණය හමුවේ මෙම තත්වය තවදුරටත් උග්‍රව ඇති බව සමාජ, ආර්ථික විශ්ලේෂකයන්ගේ මතය වී තිබේ.**

ජේ. ආර්. ගේ ආණ්ඩු පාලන ක්‍රමය වෙනුවට ජනාධිපති ක්‍රමය නොමැති නීතියේ ආධිපත්‍යය සහිත වඩා ප්‍රජාතන්ත්‍රවාදී යහ පාලනයක් ඇතිකරන බවටත්, තරුණයන්ට ලක්ෂ 15 ක රැකියා ඇතුලු 8% වේගවත් ආර්ථික සංවර්ධනයක් රටට උදාකරන බවටත් අධ්‍යාපනයට 6% ක් හා සෞඛ්‍යය ඇතුලු සමාජ සුභ සාධනයට අයවැයෙන් වැඩි ප්‍රතිශතයක් වෙන් කරන බවටත් ප්‍රතිඥාදී බලයට පැමිනි යහපාලන හවුල් ආණ්ඩුව දීර්ඝ කාලීන, මධ්‍ය හා කෙටිකාලීන විසඳුම් නොමැතිව අඳුරේ අතපත ගාමින් සිටින බව දේශපාලන විශ්ලේෂකයන්ගේ මතය වී තිබේ.

සන්ඩේ ටයිම්ස් දේශපාලන විශ්ලේෂක පවසන්නේ මේවන විට රට ආර්ථික වශයෙන් අගාධයට වැටී අවසන් බවත්, නාස්තිය, දූෂණය පිටු දැකීමට රාජ්‍ය යාන්ත්‍රණයක් නොමැතිවීම මත, පාත්‍රයද රැගෙන විදේශ දානපතියන් හමුවීමට යෑමට රජයට සිදුවී ඇති බවත්ය.

සයිටම් ගැටලුව මුල් කරගනිමින් ශිෂ්‍ය හා වෛද්‍ය ප්‍රජාව තුල පමණක් නොව සාමාන්‍ය ජනයා තුලද ඇති කර ඇති ව්‍යාකූලත්වය මේවන විට ඉතා බරපතල අර්බුදයක් බවට පත්වී ඇති අතර, රාජ්‍ය දේපල විදේශ වලට විකිණීමට, පෞද්ගලීකරණය, ජීවන වියදම ඉහල යාම හේතුවෙන් වැඩිකල වැටුප් වාෂ්පවීම, රටේ ණය බර, ආර්ථික වර්ධනයේ අඩුවීම, ගෙවුම් ශේෂ සංචිත වල අඩුවීම හමුවේ රජය අස්ථාවරවී ඇති බවත්, ආණ්ඩුවේ නොහැකියාව තේරුම්ගත් ආණ්ඩුවට ඡන්දය දුන් ජනතාවගෙන් බහුතරය, මෙම තත්වය තුල පවත්වන ඕනෑම මැතිවරණයකදී රජය පරාජය කිරීමට සිය ඡන්දය පාවිච්චි කරනු ඇතැයි දේශපාලන විශ්ලේෂක මතය වී තිබේ.

මේ අනුව ආණ්ඩුව ඡන්ද පැවැත්වීම වැලැක්වීමට විවිධ උපක්‍රම යොදමින් සිටින බව ශක්තියට වාර්තාවේ. එහෙත් ව්‍යවස්ථානුකූලව පළාත් සභා 03 ක කාලසීමාව ලබන සැප්තැම්බර් මාසයේදී අවසන් වන බැවින් ඒ අනුව එම මැතිවරණය මෙම වසර තුල පැවැත්වීම අනිවාර්ය වේ.

ආණ්ඩුවට උපදෙස් දෙන යම් උපදේශකයින් පවසා ඇත්තේ ආණ්ඩුවට පරාජයෙන් බේරීමට ඇති එකම විකල්පය ආණ්ඩු බලය පාවිච්චි කරමින් ප්‍රෝඩාකාරී ජනමත විචාරණයක් පවත්වා එම ''ජයග්‍රහණය'' මැදින් මර්ධනකාරී ආණ්ඩුවක් තනා ගැනීම බවය. පළාත් සභා ඡන්දය කල් දැමීම පිළිබඳව හීන බැලුවද තවමත් නිශ්චිත පියවරක් ගැනීමට අපොහොසත්ව සිටී.

තවද ජ.වි.පෙ. හා මුස්ලිම් කොන්ග්‍රස ඇතුලු සුළු පක්ෂ පළාත් පාලන කොට්ඨාශ නිර්නය ගැන විරුද්ධ වී ඇති බැවින් එය නැවත වෙනස් කිරීමේ අදහසක්ද ඉදිරිපත් කර ඇති බව සැලය. ඒ අනුව තවත් මාස 03 කින් පළාත් පාලන ඡන්දය නැවත කල් දැමීමට අර අඳිමින් සිටී. මෙම කුමන්ත්‍රණය සඳහා සුපුරුදු ලෙස ජනතා විමුක්ති පෙරමුණේ හා මුස්ලිම් කොන්ග්‍රසයේ සහාය ලබා ගනිමින් සිටින බවද වාර්තා වේ. පළාත් පාලන ඡන්දය මෙලෙසින් කල් දැමීම ගැන ආණ්ඩු පක්ෂයේද ආණ්ඩු පක්ෂයට සේවය කරන වෙනත් පක්ෂවලද පලාත් පාලන මට්ටමේ පාක්ෂිකයින්ද බරපතල ලෙස උරණ වෙමින් සිටින බවද, පළාත් පාලන ඡන්දය ලබා ගැනීම උදෙසා කෙරෙන උද්ඝෝෂනවලට ඔවුහු රහසිගතව සහය දැක්වීමට සූදානම් බවද ආණ්ඩු පක්ෂයේ නියෝජිතයෙක් ශක්තියට පවසා ඇත.

## රටේ පාලනය හදිසි නීතිය යටතට. තෙල් බෙදා හැරීම හමුදාව යටතට

ඛනිජ තෙල් වර්ජනයට සාමකාමී විසඳුමක් සොයාගත නොහැකි ආණ්ඩුව අත්‍යාවශ්‍ය සේවා නියෝග පනවමින් වෘත්තීය සමිති නායකයින් අත් අඩංගුවට ගෙන යූ.ඇන්.පී. මැරයන් ලවා පහර දෙමින් හමුදාව කැඳවා සේවයට යොදවා ප්‍රජාතන්ත්‍රය අකුලන පියවරකට ගමන් කරමින් තිබේ. මේ පිළිබඳව පාර්ලිමේන්තුව තුල උනුසුම් විවාදයක් ඒකාබද්ධ විපක්ෂ මන්ත්‍රීවරුන් සමඟ සිදු වූ අතර, බලහත්කාරයෙන් යෝජනා සම්මත කර ගැනීම සිදු විය. මෙයට මුහුණ දීමට අගෝස්තු 02 ජාතික විරෝධතා දිනයට වෘත්තීය සමිති පමණක් නොව සියළු බහුජන සංවිධාන කැඳවමින් රටපුරා විරෝධතාවය දියත් කිරීමට ඒකාබද්ධ විපක්ෂය තීරණ ගෙන ඇත.

ආණ්ඩුව ඡන්ද පැවැත්වීම තවදුරටත් කල් දැමුවහොත්, වැඩ කරන ජනතාවගේ ප්‍රශ්න පිළිබඳවද, රජයේ දේපල විකිණීමට එරෙහිවද වෘත්තීය සමිති පෙරට එමින් සිටින අතර, මුදල් ඇති සුදුසුකම් නැති අයට වෛද්‍ය උපාධි විකුණන සයිටම් ජාවාරමට එරෙහිවද, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පෙරටු කර ගත් වෘත්තීය සමිති බහුජන සංවිධාන, පොදු සටනකට සූදානම්ව සිටින බව එහි නිවේදකයෙක් ශක්තියට පැවසීය. මෙකී අර්බුධය මධ්‍යයේ ආණ්ඩුවේ මෛත්‍රී පාර්ශවයට අයත් ප්‍රබල ඇමති වරුන් යෝජනා කර ඇත්තේ යූ.ඇන්.පී. කසාදයෙන් වෙනුවෙන් මහින්දගේ බලවේග සමඟ එකගත්වයකට යාමය. රවී රනිල් එකතුවෙන් සිදු වූ මහා බැංකු වංචාවේ තොරතුරු ජනතාවට පුළුල්ව හෙළිදරව් වෙමිනේ ඇති බැවින් දෙපාර්ශවයේ මතබේද තවදුරටත් උග්‍ර වෙමින් ඇති බවද ශක්තියට වාර්ථා වේ.

**ආයෙත් සුදු වැන් ඇවිල්ල පුවතක්.**

**එහෙනම් සිරිසේනව උස්සන්න වෙන්නැති.**



ශක්තිය

49 1/1, විජයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස් / දුරකථනය: 011 2684820
විද්‍යුත් තැපෑල : shakthiya85@gmail.com
වෙබ් අඩවිය : www.shakthiya.org

# හංස පූට්ටුවේ යහපාලන හෙනපතය

ජාතික සංවර්ධන මාවතකින් සුභසාධන රාජ්‍යය ශක්තිමත් කර, ත්‍රස්තවාදය පරාජය කර, යුද්ධ භීෂණය නවතා, රට එක්සත් කළ ජාතික නායකත්වයක් ලෙස දකුණු ආසියානු කලාපයේ ඉහලට එසවුනු මහින්ද රාජපක්ෂ පාලනය මාරු කිරීමේ විපාකය දැන් ජනතාවට දැනෙන්නට පටන් ගෙන ඇත. පාලනය වෙනස් කිරීමට අවශ්‍ය වූයේ දේශීය විදේශීය ධනය හා බලය හිමිකාර බලවේගයන් සමඟ එක්වූ මැද පංතික කුහකයන්ටය. ඒ සඳහා ඔවුන්ගේ අනගි නිර්මාණයක් ලෙස දේශපාලන කරලියේ රඟ දැක්වූයේ ප්‍රජාතන්ත්‍රවාදී හංස පූට්ටු නාඩගමයි. ඇමරිකානු රාජ්‍ය මුදල් වැයකර, සකලවිධ ප්‍රතිගාමීත්වය ඒකරාශී කොට ඉදිරිපත් කළ රංගනය කෙලවර වූයේ තියුණු ඡන්ද සටනකින් පසු හංසයා බුලත් කොලය පරදා අලියා පිටට නැග ජනතාව යහපාලන දිව්‍ය ලෝකයට ගෙනයන සුරංගනා කතාවක් මවා පෙන්වීමෙනි.

හංස පූට්ටුවේ බලය අතට අසුවුනු වහාම ජනාධිපති ඒකාධිපති බලතල මෙහෙයවා නීති විරෝධීව පාර්ලිමේන්තුවේ බලය යටපත් කලේය. එවකට සිටි අගමැති දි.මු. ජයරත්න මහතා ඉවත් නොකරම පාර්ලිමේන්තු බහුතරයට පස්ස හරවා රනිල් අගමැති කර ඇමති මණ්ඩලයක්ද ජනපති පත් කලේය. පාර්ලිමේන්තුවෙන් ඉවත්කළ අගවිනිසුරුවරිය නැවත පත් කර, හිටපු අගවිනිසුරු බිය ගන්වා ඉවත් කර තමන්ට අභිමත කෙනෙකු පත් කලේය. නිලකාලය අවසන්වීමට පෙර බලහත්කාරයෙන් ආණ්ඩුකාරවරුන්ද වෙනස් කර පූට්ටුවේ හිතවතුන් පත් කලේය. රිලගුට දින සියයේ රංගනය ආරම්භ කලේ විදේශීය අමාත්‍යවරයා වහාම ඇමරිකානු ජනාධිපතිවරයා ඉදිරියේ දනින් වැටී ඔවුන් වැය කළ ඩොලර්වලට සරිලනසේ අතවැසි ගිවිසුමක් අත්සන් කර අප රටේ ස්වාධීනත්වය හා සම්පත් පවාදීමේ පොරොන්දුවෙනි.

රිලගුට මහමැතිවරණය සඳහා මුදල් සොයා ගත්තේ අගමැතිවරයා හා ගජමිතුරු රැල සිරිකොත කූඨ සැලසුම අනුව මහ බැංකු බැඳුම්කර හරහා ජාතික ධනය පැහැර ගැනීමෙනි. යහපාලන හංස පූට්ටුව දිව්‍ය ලෝකයට යන සුරංගනා ගමනක් නොව අපායට පිය නගන මලගමක් බව ජනතාව අතර සැකය තහවුරු විය. මේ ගැන අගමැතිට විරුද්ධව අල්ලස් හා දූෂණ කොමිසමට ඉදිරිපත් කළ පැමිණිල්ල තවමත් විභාග කර නැත. වරදකරුවන් නිදැල්ලේය. නඩුත් බඩුත් ජනපතිගේ අභිමතයේය. මේ සියල්ල ගැන ජනපතිට එරෙහිව දෝෂාභියෝගයක් ගෙනඒමේ පදනමක්ද පවතී.

මහමැතිවරණයෙන් පසුව රිනියා යහ පාලනය බුලත් කොලය මත අලි බෙටි පහරා දේශීය ආර්ථිකයත්, ජාතික ස්වාධීනත්වයත්, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද අයිතියත් යටපත් කර විදේශික ධනවතුන්ගේ සත්කාරක පාරාදීසයක් බවට අප රට පත් කරන සැලසුම එලිදැක් විය. දෙපාර්ශවයේ පූට්ටු මැති ඇමතිවරු රාජ්‍ය ආයතන, ඉඩකඩම් දේශීය සම්පත් විදේශිකයින්ට විකුණා පවුල් පිටින්ම මහ කොම්පැණි අයිතිකරුවන් වීමේ තරඟය ඇරඹුවෝය. කෘෂිකර්ම ඇමති අමාත්‍යාංශ ගොඩනැගිලි කුලියෙන් පොම්මේ ගසයි. සෞඛ්‍ය හා උසස් අධ්‍යාපන ඇමතිවරු සයිටම් මුදලාලිගේ ලුනු මල්ලේ මොර දෙති. කුප්‍රකට ව්‍යාපාරිකයෙක් වන හිටපු මුදල් ඇමති ලොතරැයි මණ්ඩලයේ දිනුම් හරහා කලු සල්ලි සුදු කරයි. කන්ටේනර් පිටින් රේගු බදු නොගෙවා රහසිගතව හොර බඩු ගෙන්වා දූෂණය රජ කරවයි. රටේ ඇමතිවරුන්ට එක නීතියකි. ජනතාවට තව නීතියකි. බැලූ බැලූ අත දූෂණය හා අවනීතිය රජයයි. මෙය නම් පුදුමසහගත යහපාලනයකි.

රූකඩ පාලක රැල පළාත් පාලන හෝ පළාත් සභා හෝ ඡන්දය පැවැත්වීම ගැන බියපත්ව ලතැවේ. එනිසා ආගමික ගැටුම් ඇති කර රටේ භීෂණයක් මතුකර, හදිසි නීතිය පනවා ඡන්ද කල්දැමීම ගැනද දුෂ්ඨ පාලකයෝ සිහින මවති. උත්සන්න වන ජනතා විරෝධය හා ජාත්‍යන්තර බලපෑම නිසා කඩිනමින් පළාත් සභා ඡන්දය පැවැත්වීම දෙසට ආණ්ඩුව තල්ලු වෙමින් තිබේ. ප්‍රෝඩාකාරී ජනමත විචාරණයක් පැවැත්වීමද දූෂිත පාලකයින්ගේ උවමනාවය. ඒ සඳහා ග්‍රාම නිලධාරී විභාගය සමත් අය ලකුණු මත බඳවා නොගෙන එම ඇබෑර්තු පිරවීම සඳහා විශ්‍රාම ගොස් ඇති පරණ යූ.ඇන්.පී. පාක්ෂිකයින් වූ වගා නිලධාරීන් සේවයේ යොදවා නව ආරයක ඡන්ද දූෂණ සූදානමක අනතුරද මතු වෙමින් තිබේ.

ජනතාවගේ ඇසට තෙවෙනි වරටත් වැලි ගැසීමට අලි - අත් පූට්ටුව සූදානම්වේ. පලමුව උතුරු මැද පළාත් සභා ඡන්දයට පූට්ටු ලැයිස්තුවක් ඉදිරිපත් කර එම සභාව දිනාගැනීමට හැකි වේතැයි සිතයි. පොදු ජන වරමේ ශක්තියෙන් ගොඩ නැගුනු ඒකාබද්ධ විපක්ෂය, යහපාලන හෙනපතය ජනතාවගේ හිසමතට කඩාවැටීමෙන් සිදුවන විනාශය වලක්වා ගැනීමට නොඉවසිල්ලෙන් දැවැන්ත ජන පවුරක බලයෙන් උද්ඝෝෂණය දියත් කර ඇත. එනිසා කුමන ඡන්දයක් පැමිණියත් මෙවර ඡන්ද සටනේදී ඒකාබද්ධ විපක්ෂයේ ගැමි ගොවි තරුණයින්ගේ උද්දාමයත් සමඟ පෙල ගැසී එල්ල වෙන දිග් පොල්පිති පහරින් ජන ජීවිතයට වින කටින අලි - අත් පූට්ටුව දෙබෑවී යන මොහොත ඉතා ආසන්නය.

# උතුරු කොරියාවට ආර්ථික සම්බාධක



ස්ටාලින්ගේ දේශය යන විරුදාවලිය ලත් උතුරු කොරියාව විසින් මිසයිල කිපයක් නොබෝදා අත්හදා බැලීම සම්බන්ධව ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර ලෝකය තිගැස්සී තිබේ. කොරියානු යුද්ධය අවසන් වීමත් සමග උතුරු කොරියාව බිහිවීම ගැන අධිරාජ්‍යවාදීන් සිටින්නේ සතුටකින් නොවේ. මේ බලවේගයන් එදා සිට අද දක්වාම ක්‍රියාකර ඇත්තේ, අධිරාජ්‍යවාදයට හා ධනවාදයට අකීකරු උතුරු කොරියාව විනාශ කිරීමටය. දකුණු කොරියාවේ රූකඩ ආණ්ඩුව මාර්ගයෙන්ද, ජපානය ලවාද, පසුගිය දශක කිහිපය තුලම බටහිර බලවතුන් උතුරු කොරියාව දුර්වල කිරීමට, නොයෙකුත් උත්සාහයන් ගත්තත්, සිය ශක්තියෙන් පමණක් නැගී සිටීමේ සිද්ධාන්තය මත ක්‍රියාකරන උතුරු කොරියාවේ දේශපාලන නායකත්වයට, එම කුමන්ත්‍රන පරාජය කිරීමට හැකි වී තිබේ. දශක ගණනාවක් උතුරු කොරියාව තනිකර ආර්ථික තහංචි දැමුවත්, උතුරු කොරියාව නොනැමී ගමන් කරයි.

**ප්‍රවීන මාධ්‍යවේදී යූ.ඊ. පෙරේරා**

**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ දිවුලපිටිය සංවිධායක - ධම්මික සංජීව සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් ජනතාවාදී තරුණ සේනාවේ දෙවැනි සමුළුව කොටදෙනියාව ලක්නාරා සම්මන්ත්‍රණ ශාලාවේදී පසුගිය දා පැවැත්විය. එම සමුළුවට ආරාධිතයන් ලෙස ප්‍ර.වා.පෙ. නායක පා.ම. වාසුදේව නානායක්කාර සහෝදරයා, ම.එ.පෙ. ගම්පහ දිස්ත්‍රික් සංවිධායක පා.ම. සිසිර ජයකොඩි, ජ.නි.පෙ. ජාතික සංවිධායක හි.පා.ම. පියසිරි විජේනායක, පි.හෙ.උ. ප්‍රචාරක ලේකම් නිතිඥ තුශාර දිසානායක යන මහත්වරු සහභාගී වූහ. අරමුණු හා ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම ජා.ත.සේ. ප්‍රචාරක ලේකම් සරත් රනසිංහ සහෝදරයා විසින් සිදුකරන ලදී. සමුළුවෙන් අනතුරුව ප්‍රදේශයේ නිවසක් අහිමිව සිටි පවුලක් වෙනුවෙන් නිවහනක් පවරාදීමේ උත්සවයද ආරාධිතයන්ගේ සහභාගීත්වයෙන් සංජීව සහෝදරයා විසින් සිදු කරන ලදී.**







# ඇමරිකානු බලපෑමෙන් දකුණු ආසියාවේ බෙදුම්වාදී ආරවුල්

ලංකාව තුලත් දකුණු ආසියාවේ සෑම රටකමත්, අද ඇති ප්‍රධාන අවශ්‍යතාවය ජාතික යහපත උදෙසා කැපවූ, ජනතාවට හිතවත්, දේශපාලන බලවේගයන්ය. සෑම රටක් ඇතුලතම භේද බින්න කිරීම් ඇති කරන්නේ අධිරාජ්‍යවාදීන් විසින්ය. මේ සඳහා අධිරාජ්‍යවාදීන් විවිධ උපක්‍රම යොදා ගනී.

එනිසාම ප්‍රථම ලෙසම දකුණු ආසියානු සහයෝගිතාව උදෙසා රටවල් සමානත්වය සහ මිත්‍රත්වය ඇති කර ගැනීමට කැමති අධිරාජ්‍ය විරෝධී දේශපාලන බලවේග සෑම රටකම ඇතිකරගත යුතුය.

අධිරාජ්‍යවාදය කුමක්ද? එය ක්‍රියාත්මක වන්නේ කෙසේද? ඔවුන්ගේ ආර්ථික උවමනාකම්, දේශපාලන බල අභිලාෂයන් සහ මිලිටරිමය සැලසුම් උදෙසා මෙලෙස ක්‍රියාත්මක වන බව ජාත්‍යන්තර විශ්ලේෂක මතයයි. ඉන්දියාව සහ පකිස්ථානය අතරත්, පකිස්ථානය සහ ඇෆ්ගනිස්ථානය අතරත් බංගලිදේශය සහ ඉන්දියාව අතරත්, ඉන්දිය බලය නේපාලය හරහා සහ අනිකුත් රටවල් අතරත්, මාලදිවයින සහ ලංකාව තුල ඇති කරන ඉන්දු ඇමරිකානු බලපෑම් මඟින් දකුණු ආසියාව තුල විශාල වශයෙන් ආරවුල් ඇතිකර තිබේ.

ලංකාව තුලද උතුරු නැගෙනහිර දෙමළ ජනතාවට විශේෂ අනුග්‍රහයක් දක්වන අධිරාජ්‍යවාදය වෙත එම ජනතාවගේ ජාතික බලවේගය නතුකර ගැනීමට පහසුකම් සලසා ගනී. මේ නිසා අධිරාජ්‍යවාදය සහ බහුතර සිංහල ජනතාව අතර පරස්පරයක් ඇති වී ති බේ. මේ යථාර්ථය මත හිඳිමින් අධිරාජ්‍යවාදයට එරෙහිව සිංහල හා දෙමළ ජනතාව එක්සත්වීමේ අවශ්‍යතාවය පිළිගන්නා දේශපාලන බලවේගයක් රටතුල ඇතිකර ගත යුතුය. මේ සඳහා මෙකී අරමුණ ඇති දෙමළ දේශපාලනයක් මතුවිය යුතුය. ඒ සඳහා වූ බීජයන් දැනට මතුවෙමින් ඇත. එනිසා සෑම රටක් තුලම ජාතික යහපත පෙරටු කරගත්, දකුණු ආසියානු රටවල් අතර ගැටුම් ඇති කිරීමට විරුද්ධ දකුණු ආසියානු මිත්‍රත්වය අගයන ජනතාවාදී බලවේගයන් සෑම රටකම ඇතිකර ගත යුතුය යන අදහස සමාජවාදී ජනතා පෙරමුණ තුලද සාකච්ඡා වූ බව වාර්තාවේ.

# ජාතික සම්පත් විකුණනන් කන දෙබිඩි ආණ්ඩුවට අසාධ්‍යයි.

නිරිතදිග මෝසම ඇරඹුනේ මහා විනාශයකිනි. එකවිට ඇද හැලුනු ධාරානිපාත වර්ෂාවෙන් ගංවතුර, නායයාම් නිසා ජන ජීවිතය දිස්ත්‍රික් ගණනාවකම මුළුමනින්ම බිඳ වැටුනි. සොබාදහම කෝපවී ඇති ආකාරය හැමටම දැනෙන්නට විය. මෙවර ජීවිත අහිමිවීම්, අතුරුදහන්වීම් හා අවතැන්වීම් මෑත කාලයේදී සිදු නොවුන තරම් ඉහල මට්ටමක් විය. මෙයින් පෙන්නුම් කරන්නේ ස්වභාවික දූපත් පරිසරය වනසමින් සිදු කරන සංවර්ධනය අවසානයේ රටත් ජනතාවත් විනාශ කරන ආකාරයයි. කඳු විනාශය, වගුරු විනාශය, ඇල දොල ගංගා විනාශය, පස විනාශය අවසානයේ මිනිසාගේ විනාශය දක්වා දිග්ඇදී යන බව සිදුවීම් වලින් පැහැදිලිය. මෙවර ආපදාවේදී පැහැදිලිව පෙනුන අනෙක් කරුණ වූයේ රජයක් නොමැති අරාජිකත්වයක් දින කීපයක් පැවතීමයි. රජයේ හමුදාවන්ට සිදු වූයේ දින කීපයකට පසුව මිනී ගොඩගැනීම හා ඇදවැටුනු කඳුකපා පාරවල් විවෘත කර කොටුවී සිටි ජනතාවගේ ජීවිත ආරක්ෂාවට පියවර යෙදීමය. රජයේ සේවකයෝ මානුෂිකත්වය පෙරදැරිව අවතැන් කඳවුරු ස්ථාපනය හා ආහාරපාන බෙදාදීම කඩිනමින් සිදු කලෝය. ජනමාධ්‍ය මගින් මුළු ජනතාවගේ විඥානය අවදි කරමින් ජනතා සේවය උපරිම ලෙස ඉටු කලේය. පළාත් පාලන මන්ත්‍රිවරුන් නොමැතිවීමේ හානියද ජනතාවට හොඳින්ම දැනුනි. රජයේ බොහෝ මැතිඇමතිවරුන් වාහන සංදර්ශනයන් අවතැන් වූවන්ට පෙන්විය.

## ගෝල්පේස් සුලඟ රට පුරා හමයි.

මැයි දිනයෙන් ඇරඹුනු ගෝල්පේස් දැවැන්ත රැලිය ඉතිහාසයේ සම කල හැකිවන්නේ 1953 හර්තාලයට පෙර පැවති ගෝල්පේස් රැස්වීමටය. හතර දිග්භාගයෙන් සංවිධානාත්මකව මෙන්ම ස්වේච්ඡාවෙන් ඇදී ආ ජනතාව පෙන්නුම් කලේ නව මාවතකින් ඉදිරියට ගමන් කර ආණ්ඩුව වෙනස් කිරීමේ අවශ්‍යතාවයයි. මෙම රැලියට කොළඹ නගරය හා අවට අඩුආදායම්ලාභී විශාල සටන්කාමී ජන සහභාගීත්වය පෙන්නුම් කලේ මැතිවරණය නොපවත්වන්නේ නම් ජාතික විරෝධතාව සමඟ මතු වන හර්තාලයකදී කොළඹ නගරය හෙල්ලුම්කවන ජන ක්‍රියාකාරීත්වයකට සූදානම් බවය. මැයි දිනයෙන් ඇරඹුනු ආණ්ඩු විරෝධී ගෝල්පේස් සුලඟ වැඩබිම්, ගොවිබිම් සිසාරා රටපුරා හමායාමට පටන් ගෙන තිබේ. එහි බලපෑමෙන් ආණ්ඩුවේ වරප්‍රසාද භුක්තිවිඳින ආණ්ඩුවට සම්බන්ධ ශ්‍රී ල.නි.ප. මැතිඇමතිවරුන්ගේ හදවත් සැලෙමින් ජනතාවගෙන් සමාව ඇයදීමේ අඳෝනාවල් පුවත්පත්වල පිටු පුරවමින්ද විද්‍යුත් නාලිකා ඔස්සේ විකාශනය වෙමින්ද තිබේ. තවමත් ආණ්ඩුවේ ගොමපස් රසකර බුක්තිවිඳින්නේ ජනතාව විසින් පරාජය කල ජාතික ලැයිස්තුවෙන් පත්වී ඇමතිකම් ලබාගත් කිහිප දෙනාත්, පක්ෂය පාවාදී සිරිසේන සමඟ මුල් වටයේ එක්වූ අයත්, රාජපක්ෂ රජයේ අමාත්‍ය ධූර දරමින් සිට අවසාන මොහොතේ යූ.ඇන්.පී.යට පැන වහසි බස් දොඩවන වාචාලයන් කීප දෙනෙකි. මොවුන් අතරින් සමහරෙක් දෙකොනම මුට්ටුවී මල්ලෙ පොල් කථා කියති. ඡන්දයෙන් පත්වූ ශ්‍රී ල.නි.ප. ජනතා නියෝජිතයෝ සියලු දෙනා මැයි දින සුලඟින් ඇඹරෙමින් මුල් බුරුල්වෙමින් අතු කඩා හැලෙමින් නලියමින් සිටිති. ඔවුහු පළාත් පාලන ඡන්දයට පෙර ඉදිරියට යායුතු මාවත තෝරාගැනීමට ඉව අල්ලති.

## තුන් ඇඳුතු විදේශීයකරණයක්

ලංකාවේ සංවර්ධන මාවත ගැන ජේ.ආර්. සිතුවේ සිංගප්පූරුවක් කරන්නටය. රතු චීනයට රුසියාවට විරුද්ධව අධිරාජ්‍යවාදී තිත්පොලක් බවට රට පත් කළවිට ආර්ථික සමෘද්ධිය ලබා ගත හැකි බව ඔහුගේ එදා තේරුම විය. වර්තමානයේ රනිල් ඇතුලු යූ.ඇන්.පී.ය නඩයත් ශ්‍රී ල.නි.ප. දක්ෂිණාංශික අතලොස්සත් තවමත් කල්පනා කරන්නේ පැරණි මාවත ගැනය. මොවුන්ට තවමත් නොතේරෙන්නේ අධිරාජ්‍යවාදය බිඳ වැටෙමින් ඇති අතර අද ලෝකය උඩුයටිකුරු වෙමින් ඇත. නව ලිබරල් මාවත ඇමරිකාවේ යුරෝපයේ ජනතාව ප්‍රතික්ෂේප කර ඇති බව මැතිවරණවලින් පෙන්වයි. ලංකාවේ අඩුදියුණු දක්ෂිණාංශිකයෝ තවමත් එයම බදාගෙන වැලපෙති. එදා බණ්ඩාරනායකවරු හා වාමාංශිකයින් කල්පනා කලේ නොබැඳි පිලිවෙතක්, ජාතික ආර්ථිකයක්, සුභසාධන රාජ්‍යයක් පදනම්ව රටත් ජනතාවත් සංවර්ධනය කිරීමටය. ඒ සඳහා ලෝක ජාතීන් සමඟ සම්පව කටයුතු කිරීමට ලංකාවට හැකිවිය. එම පිලිවෙත් පසෙකට දමා වර්තමානයේ ලංකාවේ ගමන් මග තුන් ඇඳුතු විදේශකරණයකට සේන්දු කර තිබේ. උතුරු නැගෙනහිර ඉන්දියානු ආධිපත්‍යයට භාර කර ඇත. අගමැති මෝඩි සමඟ වෙසක් උත්සවය සැමරීම පමණක් නොව, ත්‍රිමලය තෙල් ටැංකි, ඉඩකඩම්, දුම්රිය, අධිවේගී මාර්ග හා ඉර්කා ගිවිසුම අත්සන් කර ඉන්දියානු සේවකයින් කැඳවීම දක්වා ජාතික ස්වාධීනත්වය කෙලෙසන ආකාරයේ බැඳීම්වලට මුලය අගේනිය නිසා ජනපති අගමැති එකඟතාවය පලකර ඇත.

අනිත් අතින් චීනයෙන් මුදල් ගැරීම සඳහා එලෙසම හම්බන්තොට වරාය ගුවන් තොටුපල ඇතුලු දේශීය සම්පත් චීන කොම්පැනිවලට පවරමින් තිබේ. බටහිර උවමනාව හා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ලංකාවේ භූමිය භාරදී ත්‍රිකුණාමල වරාය යුධ කඳවුරක් බවට පරිවර්තනය කිරීමටද දකුණු මුහුදු මාර්ගය පාලනය බටහිරට භාරදීමටද සැරසේ. රට මධ්‍යයේ පවතින ඉඩකඩම් හා දේපොල විදේශිකයින්ට අත්පත් කර ගැනීමට නීතිරීති සම්මත කර තිබේ. මෙයින් සිදුවන්නේ රටත් ජනතාවත් විදේශීයකරණයකට ලක් කර ජනතාවගේ ආර්ථික වටපිටාව මුළුමනින්ම බිඳදමා ලාංකිකයින් විදේශිකයින්ගේ කුලිකාරයින් බවට පත් කිරීමය. එම සැලස්ම සඳහා නිදහස් අධ්‍යාපනය බිඳීමටත්, උගත් වෘත්තික අයිතිය වැනසීමටත් සැරසේ. සෞඛ්‍ය සේවයට නොමිලේ ලැබුණු දායාදයක් බව පෙන්වමින් ඉන්දියානු ඇම්බියුලන්ස් සේවය ගෙනආ ආකාරයෙන් (රජයේ මුදල් කෝටි 11ක් ඒ වෙනුවෙන් ගෙවා ඇත) රජයේ ආයතන හා සේවාවන් විදේශික කොම්පැණිවලට පැවරීමට ජනපති අගමැති හා යූ.ඇන්.පී. මැති ඇමතිවරුන්ගේ ක්‍රියාකාරීත්වය ඒ තිබේ. මෙය සංහිඳියා මාවතක් බව පෙන්වයි. රටතුල සංහිඳියාවක් ඇති වන්නේ විදේශීයකරණයෙන් නොව ලාංකීය ජනතාවගේ එක්සත්කමත්, දකුණු ආසියානු සංහිඳියාවක් සඳහා පෙනීසිටීමෙන් පමණය. එනිසා දකුණු ආසියාවෙන් අධිරාජ්‍යවාදීන් පිටවෙයව් යන මාවත ඔස්සේ ප්‍රගතිශීලීන් හා වාමාංශිකයින් එක්වී ජනතා ද්‍රෝහී වර්තමාන පාලක සභාගය බිඳ දැමීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

## සුභසාධන පහසුකම් වැනසීමේ වසංගතය

මෙතෙක් කළුක් නොවූ වීරු ලෙස ඩෙංගු වසංගතය සීඝ්‍රයෙන් පැතිර යමින් තිබේ. රෝහල් පිරී ඉතිරී ගොස් රජයක් නොමැති අසරණ බවක් මතුවී තිබේ. රෝහල් කාර්ය මණ්ඩලයට දැරිය නොහැකි තරමින් රෝගීන්ගෙන් රෝහල් පිරී ඉතිරී ගොස්ය. ඩෙංගු මරණ සංඛ්‍යාව දිනෙන් දින වැඩිවේ. බලධාරීන් මරණ සංඛ්‍යා සඟවා තැබීමට තීරණ ගෙන ඇති බව සැලයි. තානාපති කාර්යාල සංචාරකයින්ට අනතුරු අඟවා අන්තර්ජාලය ඔස්සේ දැනුම්දී තිබේ. ජනපති පරිසර පද්ධතියට කුණු බැහැර කර රටම වැනසීමට කටයුතු කරන අතර, සෞඛ්‍ය ඇමතිවරයා හා අගමැතිවරයා දිවා රෑ නොතකා වෙහෙසෙන්නේ සයිටම් පුද්ගලික උපාධි කඩය නීත්‍යානුකූල කර 1977 ඇරඹි සෞඛ්‍ය හා අධ්‍යාපනය පුද්ගලීකරණය කිරීමේ යූ.ඇන්.පී. ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමටය. මොවුන්ට රෝගී මරණ සුළු දෙයකි. නිදහස් අධ්‍යාපන වරමින් මැති ඇමතිවරු වී සමාජයේ ඉහලින් වැජඹෙන ඔවුහු අද ඉහලට නැගුනු ඉනිමගට පයින් ගසා ධනය ඇති හැකි සුළු පිරිසකගේ ගොඩට එකතු වී කොම්පැණිකරුවන්ගේ සුභසෙත හා උවමනාව වෙනුවෙන් පෙනී සිටිති. අතිවිශාල දුප්පත් ජනතාවක් රෝගීයෙන්, සාගතයෙන්, ජීවන මාර්ග කඩාබිඳ දැමීමෙන් හා ස්වභාවික ආපදා නිසා ව්‍යසනකට පත්ව ඇති වර්තමාන යුගයේ සෞඛ්‍ය ඇමති, උසස් අධ්‍යාපන ඇමති හා අගමැති ඇතුලු යූ.ඇන්.පී. නඩය පෙනී සිටින්නේ සයිටම් කඩයෙන් කෙරෙන රාජ්‍ය සංවර්ධන ඉලක්කයන් වෙනුවෙන්ය.

එනිසා අතලොස්සකගේ අසාධාරණයට විරුද්ධව ජේ.ආර්. යුගයේ මුහුණ දුන් ආකාරයටම වැඩකරන ජනතාවත්, සිසුනුත්, දොස්තරවරු ඇතුලු අනෙකුත් විද්වතුනුත් එකපෙලට සිට ගෙන සුභසාධන රාජ්‍ය පදනම රැකගැනීමේ සටන මහපාරට කැඳවීමේ අවශ්‍යතාවය මතු වෙමින් ඇත. උද්ඝෝෂණය කරන සිසුන්ට පොලිසිය ලවා පහරදී ඔවුනගේ අත්පා බිඳ හිස් පොඩිකර, රෝහල්ගත කර උසාවි දමා සිරගත කර මෙයට විසඳුම් සෙවිය නොහැකි බව ජේ.ආර්. ප්‍රේමදාස මෙන්ම වර්තමාන පාලකයින්ද අවබෝධ කර ගත යුතුය. එනිසා විශ්ව විද්‍යාල සිසුන්ගේ පංති වර්ජනය මෙන්ම, දොස්තරවරුන් කඩින් කඩ ගෙනයන වැඩවර්ජනයන්ද සර්ව සාධාරණය. යුක්තිසහගතය. එය ඔවුන්ගේ රැකියා අනතුර පමණක් නොව මතු පරපුරේ අයිතිය වෙනුවෙන් අද යුගයේ විද්වත් වෘත්තිකයෝ ලෙස සිදු කරන උතුම් පරිත්‍යාගශීලී අරගලයන්ට ජනතාවගේ ආශිර්වාදය හිමිවිය යුතුය. ශ්‍රී ල.නි.ප.යට උරුම කියන ජනාධිපතිවරයාද කොම්පැණිකරුවන්ගේ ගැත්තෙක් ලෙස සිටිනවාට වඩා සිදු කළ යුතු වන්නේ තමන් සතු ව්‍යවස්ථාපිත බලතල ජනතාවගේ යුක්තිසහගත උවමනාව වෙනුවෙන් ක්‍රියාවට නැගීමය. බණ්ඩාරනායක අගමැතිතුමා ශ්‍රී ල.නි.ප. දේශපාලනයෙන් පෙන්නා දුන් ඓතිහාසික ආදර්ශය එයයි.



## ආණ්ඩුව බිඳ වැටීම අතළඟයි.

සිරිසේනගේ සහ වික්‍රමසිංහ ආණ්ඩුව දෙපළු කළ හැකි ප්‍රමුඛ ජනබලවේගය ඒකාබද්ධ විපක්ෂයයි. මේ ආණ්ඩුව දෙබෑ කරන යගදාව ඒකාබද්ධ විපක්ෂයයි. එහි නිල මහා යෝදයා මහින්ද රාජපක්ෂ බව ජනතාවගේ රොදබැඳීම පෙන්වයි.

අගමැති වික්‍රමසිංහ මහ බැංකු කොල්ලයත් සමඟ හොරුන් රැකන නායකයෙක් බව හෙලිදරව් වී ඇති අතර, ජනපති සිරිසේන කටින් බතලකොල සිටවන දරදඬු අධිපතිවාදී ලෙස ජනතාව කෙටි කලකින් හඳුනා ගෙන හමාරය.

රුපියල කඩාවැටෙමින් රට බංකොලොත් වෙමින් ජනතාව මහපාරට පැමිණීමට සූදානමින් පසුවන බව ශ්‍රී ල.නි.ප. ඡන්දයෙන් පත්වූ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ට දැනෙන්නට පටන් ගෙන ඇත. ඒ නිසා කවුරු ආවත් නාවත් ඔවුන් තනි තනිව හෝ ආණ්ඩුවෙන් ගැලවී ස්වාධීනව විපක්ෂයේ අසුන් ගන්නා මොහොත ලං වෙමින් තිබේ. මුස්ලිම් මන්ත්‍රීවරු මෙන්ම යූ.ඇන්.පී.යේ රටට ආදරය කරන ජනතා නියෝජිතයින්ද කලබලයට පත්වී සිටී.

ඔවුන්ද බලාපොරොත්තු වන්නේ රනිල් අගමැති වෙනුවට වෙනත් අයෙක් පත් කිරීමට පියවරක් ගැනීමටය. අගමැති වික්‍රමසිංහ ඇද වැටෙනවිට ජනපති සිරිසේන තුබසට වැදුනු තලගොයෙකු මෙන් බිම බදාගෙන වැලපෙනු ඇත. රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගැනීමට වහාම කළ යුතුව ඇත්තේ අන්තර්කාලීන ආණ්ඩුවක් ඇති කර අගමැති ලෙස සුදුසු අයෙක් පත් කර ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද වරම ක්‍රියාවට නැගීමට ඉඩ හැරීමය.

සිරිසුමන විදානපතිරණ
2017-07-10

## ජනතාව මිරිකමින් විදේශිකයින් අස්වැද්දීම

මහජන සන්තකය, රජයේ දේපොල ආරක්ෂාව, ජාතික නිදහස හා ස්වෛරීත්වය තර්ජනයට ලක්වී ආර්ථිකය බිඳ වැටෙමින් පවතින අතර, බඩු මිල ඉහල යමින් සාමාන්‍ය ජනතාවට ජීවත්වීමට නොහැකි තරමේ ආර්ථික පීඩනයක් දැනෙන්නට පටන්ගෙන තිබේ. ඡන්දය කල්දමා, ජනතාවගේ ඡන්ද අයිතිය යටපත් කර ආණ්ඩුව ඇදි ඇදී ගමන් කරමින් නොපනත් ක්‍රියාවන් සිදුකරයි. විදේශ බලපෑමට අනුකූලව ව්‍යවස්ථා වෙනසකට මඟපාදන අතර, ආදායම් බදු එකතු කර ගැනීමේ නව කෙටුම්පත සකසා ඇත්තේද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුවය. එනිසා විදේශීය හාම්පුතුන්ගේ ආදායම සරුකර ණය පොලී, වාරික එකතු කර පියවීම සඳහා ඉදිරියේදී කොම්පැනිකරුවන්ගේ බර ලිහිල් කර සාමාන්‍ය ජනතාව මිරිකමින් බදු එකතු කිරීම ආණ්ඩුවේ සැලසුම වී තිබේ. එම පිලිවෙත පරාජය කිරීමට සියලුම රාජ්‍ය ආයතනවල සේවකයින්ද මහජන සංවිධානද ඒකාබද්ධ විය යුතුයි. දැවැන්ත සංකේත වර්ජන ක්‍රියාවලියකට සමගාමීව ජාතික විරෝධතා දිනයක් පැවැත්වීම සඳහා වැඩබිම් මට්ටමේ නියෝජිත සමුළු පවත්වා, වැඩකරන ජනතා බලවේගය ඒකරාශී කර, දැනටමත් සටනට අවතීර්ණ වී ඇති සංවිධාන මෙන්ම විපක්ෂයද ජන සටනට සූදානම් විය යුතු කාලය එළඹෙමින් ඇත.

# නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍යය

## ● විශ්‍රාම වැටුප් කප්පාදුවට ● රාජ්‍ය ආයතන විකිණීමට ● ශ්‍රම කොල්ලය




**නිදහස් අධ්‍යාපනයත්, නිදහස් සෞඛ්‍යයත් වනසන මාලබේ සයිටම් හොර උපාධි කඩය අහෝසි කරන ලෙස පාලකයන්ට බලකරමින් ශිෂ්‍ය ව්‍යාපාරයේ හා වෛද්‍ය නිළධාරීන්ගේ සංගමයේ නායකත්වය යටතේ අඛන්ඩව සිදුකරගෙන ආ අරගලය මේ මොහොත වනවිට දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති, බහුජන සංවිධාන ඇතුළු එකතු කරගත හැකි සියලු බලවේග එක්රැස් කරගත් පුළුල් ව්‍යාපාරයක් බවට පත්වෙමින් සිටී.**

**සයිටම් කියන්නේ සුදු පෞද්ගලික විශ්ව විද්‍යාලයක් විතරක් නොවෙයි. මේ ආයතනය හරහා ආණ්ඩුව සාකච්ඡා කරන්න හදන්නේ අධ්‍යාපනය, සෞඛ්‍ය විකුණන ප්‍රතිපත්තිය. ඒ නිසා අපි කියනවා ඒකට ආණ්ඩුවට ඉඩ දුන්නොත් ඒක හරියට සමාජයක් විදිහට අපේ බෙල්ල අපිම කපාගන්නවට සමානයි.**

ආණ්ඩුව මේකට කියන්නේ අධ්‍යාපනය විකුණන වැඩපිළිවෙළේ නියමු ව්‍යාපෘතිය කියලා. ජනතා විරෝධය කුඩුපට්ටම් කරලා සයිටම් නීතිගත කරන්න ඉඩ දුන්නොත් ආණ්ඩුව ඒකෙ හයියත් අරගෙන අධ්‍යාපනය, සෞඛ්‍ය මුළුමනින්ම විකුණාදමන එක වලක්වන්න බෑ. අපි දන්නවා ආණ්ඩුව ඒකට නොකරන දෙයක් නෑ. අධ්‍යාපනය, සෞඛ්‍ය විකුණන්න ඉඩදුන්නොත් ඒකෙ ප්‍රතිඵලය මොකද්ද? කෝටි ගණනින් ගෙවන්න බැරිනම් ඒ කාටවත් අධ්‍යාපනයක් නෑ. ලෙඩ ඇඳේ මැරිලා ගියත් බෙහෙත් ටිකක් ගන්න ලැබෙන්නෙ නෑ. දැනටත් රටේ මේ තත්ත්වය තිබෙනවා.

දරුවෙක් හොඳ පහසුකම් තියෙන පාසලකට ඇතුළත් කරන එක ලක්ෂයක් දෙකක් ගෙවාගන්න බැරි දෙමාපියන්ට හීනයක් විතරයි. සැත්කමක් කරගන්න වුණාම පාරේ හිඟාකන්න වෙන එක, පෝලිම් වල ඉඳල මියදෙන්න වෙන එක ඇරෙන්න වෙන උත්තර නෑ. අපි අහනවා දරුවන්ට පොතපත අරන්දෙන්න බැරුව,

අම්මලා ගඟේ, මුහුදේ පනින රටක ලක්ෂ 120 කට උපාධිගන්න පුළුවන් කියන එක විහිළුවක් නෙවෙයිද? ලෙඩ දුක් හැදිලා ප්‍රතිකාර නැතුව මියදෙන ඥාතීන් ඉස්සරහ කරකියාගන්න දෙයක් නැති අසරණ ගැහැණු මිනිස්සු කී දෙනෙක් මේ රටේ ඇත්ද? මේ දැනට තත්ත්වය විතරයි. මුළුමනින්ම මේ සියල්ල විකුණුවොත් මොකක් වෙයිද? ඒ නිසා අපි කියනවා සයිටම් සටන පරාද වෙන්න දෙන්න බෑ.

අනෙක් පැත්ත මේ සියල්ල වෙළඳභාණ්ඩ වූ තත්ත්වයක් යටතේ සමාජයට අත්වන ඉරණම මොකක්ද? ලාභය මූලික වුණොත් ඒ කොතනකදිවත් ප්‍රමිති තියෙන්න විදිහක් නෑ. අපේ රටේ මේ පිළිබඳ අත්දැකීම් ඉහේ කෙස් ගානටත් වැඩියි. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ මේ තත්ත්වය ඉතාමත් බරපතලයි. රෝහල්වලින් රෝගීන් යවන්නේ අවයව පවා ගලවාගෙන කියන එක රහසක් නෙවෙයි. වකුගඩු ජාවාරම එක් නිදසුනක් විතරයි. හැබැයි මේ සියල්ල තියෙද්දිත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියේ නම් වෙනසක් නෑ. මේ අන්ත දූෂිත ආයතනය රකිනවා. ධනපති මාධ්‍ය ඒ සියල්ල සමාජය තුළ සුජාත කරමින් ඉන්නවා. මොකද මේ කාටවත් මේවයෙන් ජනතාවට සිද්ධවෙන හානිය වැදගත් නෑ. මිනිස් ජීවිතවලට අද වටිනාකමක් නෑ. වැදගත් දේපල, ලාභ මේවා විතරයි. ඒ නිසා සයිටම් වසා දැමීම, සයිටම් තුලින් මතුවෙන අධ්‍යාපනය විකුණන ප්‍රතිපත්තිය පරාජය කිරීම අත්‍යාවශ්‍යයි.

මේ තත්ත්වය අද සයිටම් එකට විතරක් ලඝු කරන්න බෑ. ජනතා අයිතීන් දිනෙන් දින උදුරාගන්නා ව්‍යාපෘති තව තවත් ක්‍රියාත්මකයි. පෞද්ගලික විශ්ව විද්‍යාල ගත්තත් තව තොග පිටින් දාන්න නියමිතයි. ආණ්ඩුව දැන් සියලු රාජ්‍ය ආයතන විකුණන්න පිඹුරුපත් සකසලා තියෙනවා. විශ්‍රාම වැටුප්, සමාජ ආරක්ෂණ සේවා උදුරාගනිමින් ඉන්නවා. එට්කා වගේ ගිවිසුම් අත්සන් කරන්න නියමිතයි. දැන් මේ සියලු විනාශයන් ඉස්සරහ නිහඬව වැනසෙනවාද? නැත්නම් ජීවිතය වෙනුවෙන් සටන් වදිනවද? අපි ඉදිරියේ තියෙන්නෙ මේ විකල්ප දෙක විතරයි.

ඒ නිසා අපි කියනවා සයිටම් අරගලය ශිෂ්‍යයින්ගෙ හරි වෛද්‍යවරුන්ගෙ හරි පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේක මුළුමහත් සමාජයක අයිතීන් පිළිබඳ අරගලයක්. ජනතා අයිතීන් කප්පාදුවට හා විනාශකාරී පෞද්ගලීකරණයට එරෙහි පොදු සටනක්. හැබැයි අද ආණ්ඩුව මේ අරගලය හුදකලාකරන්න හදනවා. උද්ඝෝෂණවලට වැඩවර්ජන වලට එරෙහිව ජනතාව උසිගන්වන්න හදනවා. මහජන පීඩාව, පොදු දේපල රැකීම, කාර්මික සාමය මේවා ඉස්සරහට දාගෙන අද ආණ්ඩුව කරන්න හදන්නෙ මොකද්ද කියලා අපි තේරුම්ගත යුතුයි. ජනතාව පීඩාවට පත්වෙන්නෙ උද්ඝෝෂණ නිසා නෙවෙයි. දේපල විනාශ කරන්නේ උද්ඝෝෂකයො නෙවෙයි. කාර්මික සාමය ව්‍යාජයක් විතරයි. ඒ නිසා අපි කියන්න කැමතියි නැවත නැවතත් සටන් වැදීම ඇරෙන්න ජනතාවට සිය අයිතීන් වෙනුවෙන් වෙන විකල්පයක් නෑ.

ඒ නිසා අපි කියනවා සියලු අරගල ඒකාබද්ධ කිරීම, සහයෝගයෙන් සටන්වැදීම අවශ්‍යයි. ශිෂ්‍ය ව්‍යාපාරය විදිහට මේ රටේ සියලුම සටන්කරන බලවේග එක්කරගනිමින් සයිටම් විරෝධී සිසු ජන ව්‍යාපාරය හරහා මේ සටන් ඉදිරියට ගෙනියන්න. ඒ වෙනුවෙන් කොන්දේසි විරහිතව සටන්කරන්න අපි සූදානම්. ඒ අරගලයට ඔබත් එක්වන්න එක්ව සටන් කරන්න පෙරට එන්න.

**- සයිටම් විරෝධී සිසුජන ව්‍යාපාරය -**

## ලහිරු ඇතුළු සිරකල සිසුන් වහාම නිදහස් කරනු

නිදහස් අධ්‍යාපනයට එන කටින සයිටමයට එරෙහිව නැගීසිටි සිසුන්ගේ හඬට කන්දීම වෙනුවට, ඔවුන්හට කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කිරීම සහ ඔවුන් සිරගත කිරීම හුඹස් බියගුළු ක්‍රියාවකි.

සයිටම් නැමති වෛද්‍ය අධ්‍යාපනයේ විකෘති කලු අවතාරය වහාම තුරන් කොට, නිදහස් අධ්‍යාපනය සුරැකීම සඳහා පියවර ගැනීමට බලකරමින් ශිෂ්‍ය ව්‍යාපාරය සහ විද්වත් වෛද්‍ය නිළධාරී සංගමය දශක කිහිපයක්තිස්සේ ගෙනගිය අරගලය අද නැවත මතුවී ඇත. පෙර දින මෙන්ම නැවතත් මෙම අරගලය ජයගනු නොඅනුමානය. මෙම රජය පෙරලී යාමෙන් හෝ එය විය යුක්තකි. ඒ සඳහා වූ හේතු යුක්තියත්, ජන විඥානයේ ඓතිහාසික ප්‍රබලත්වයත් පරාජය කිරීමට මේ රජයට හෝ කිසියම් රජයක ප්‍රතිගාමීන්ට කිසිසේත් නොහැකිවනු ඇත.

මෙම පසුබිම තුල ශිෂ්‍ය ව්‍යාපාරයේ යුක්තිසහගත අරගලයට එල්ල කල කඳුලු ගෑස් ප්‍රහාරයේ ප්‍රචණ්ඩත්වය රජයට එරෙහි වූ දෝංකාරයක් ලෙස නැගී එනු ඇත. සයිටම් රකිමින් නිදහස් වෛද්‍ය අධ්‍යාපනය රැකිය නොහැකිය. රජයේ අතරමැදි විසඳුම් සයිටම් අවතාර රැකීම සඳහා ඉදිරියට දැමූ ප්‍රයෝගයකි. අධ්‍යාපනයේ නිදහසත්, නිදහස් අධ්‍යාපනයත් එකක් මිස දෙකක් නොවේ. මෙය එකිනෙක පටලැවීමට රජය දරණ දීන උත්සාහය අපි හෙළා දකිමු. නිදහස් අධ්‍යාපනයත් නිදහස් සෞඛ්‍ය සේවාවත් නිසා දිගු කාලීනව ගොඩනැගුනු ලංකාවේ ජාතික දියුණුව තිරසර ශක්තිය සහ අභිමානය කවර වියදමකින් හෝ සුරැකිය යුතුය. ලහිරු වීරසේකර ඇතුළු සිරකල සිසුන් වහාම නිදහස් කරනු.

**- වාසුදේව නානායක්කාර -**

## සයිට... ජ... දේ...

මැයි ම... නිලධාරීන්ගෙ... වෘත්තීය ස... රැස්වීමට ... පැහැදිලි වූ... මහා වැඩ ... සූදානම් බව...

මෙහිදී ... කලේ ප්‍රධා... සම්බන්ධයෙ... යුතු බවය. මෙම වැඩ ව... ප්‍රධාන පිටු... දුන්න.

වෛද්‍යව... පීඩාවට ප... අසරණ රෝ...

## ... ස්වා...

සයිටම් ආ... පාර්ලිමේන්තු... දන්වා යවා ...

1. වෛද්‍ය අ... ක්‍රියාමාර්ග...
2. සයිටම් ආ... ලබාදීමට ...
3. වෛද්‍ය ව... ශ්‍රී ලංකා ...

පොදු ජනතා... වාතාවරණය... ඉල්ලා තිබේ.

# ...යත් වනසන සයිටම් උපාධි කඩය වසනු

## ...ට ● එට්කා ගිවිසුමට එරෙහිව සටන් වදිව් ! - සිසුජන ව්‍යාපාරය -





## ...ම් අරගලයේ වැදගත්කම ගැන ...තාව දැනුවත් කිරීමේ වගකීම ...ශපාලන පක්ෂ භාරගතයුතුය !

...ස 29 දින රජයේ වෛද්‍ය ...ත් සංගමය විසින් කැඳවා තිබූ ...මිති හා පක්ෂ එකමුතු වේ. ...අප ද සහභාගී වූයෙමු. එහිදී ...යේ 29 දායින් පසු ඕනෑම දිනක ... වර්ජනයක් කැඳවීමට ඔවුන් ...යි.

...ඔවුන්ගේ දැඩි අවධානය යොමු ...ාන දේශපාලන පක්ෂ මේ ...න් නිශ්චිත මැදිහත්වීමක් කල ... නිදහස් අද්‍යාපනය රැක ගැනීමේ ...ර්ජනය සාර්ථක කර ගැනීමට එය ...බලයක් වන බව ඔවුහු පෙන්වා

...රුන් වැඩ වර්ජනය කිරීමේදී ...ත්වන්නේ රෝගීන් බැවින් දුප්පත් ...ගීන්ව වෛද්‍යවරුන්ට විරුද්ධව පාවිච්චි කිරීමට රජයට හැකියාව ඇති බැවින් මෙම අරගලයේ ඇති වැදගත්කම ගැන මහජනතාව දැනුවත් කිරීම ප්‍රධාන දේශපාලන පක්ෂ වල වගකීම බව පවසන ලදි. සමහර දේශපාලන පක්ෂයක් මෙහි ඇති බැරෑරුම්කම ගැන අවධානයක් නොයෙදවීම රජයට වාසියකි. මෙම මූලික අයිතිය පිළිබඳව සටන් නොකර, කරනු ලබන දේශපාලනය කුමක්දැයි මෙම පක්ෂවලින් ප්‍රශ්ණ කිරීමට සිදු වන බව මෙම රැස්වීමේදී පැවසීය.

එබැවින් මෙම තත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සියලුම දේශපාලන පක්ෂ වල වගකීම බව මෙම රැස්වීමේදී අවධාරණය කලෙමු.

විජය බන්දුල නානායක්කාර
ප්‍රධාන ලේකම්
සමූපකාර ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය

## ...සයිටම් ආයතනය ගැන රජයේ ...වරය ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වන්න

...යතනය පිලිබඳව රජයේ ස්ථාවරය ශ්‍රේෂ්ඨාධිකරණයට දැනම් දෙන ලෙස ...ු මන්ත්‍රි වාසුදේව සහෝදරයා විසින් නීතිපතිතුමා වෙත 20170717 දින ලිපියකින් ...ැත.

...ධ්‍යාපනයේ අවම ප්‍රමිතිය නීතියක් බවට පත් විය යුතු නිසා ඒ සඳහා අවශ්‍ය ...ා කඩිනමින් ගත යුතු බවත්,

...යතනය විසින් දැනට ලබා දී ඇති උපාධිය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ...නුසුදුසු බවත්,

...ත්තියට අදාල තාක්ෂණික තීරණ ගත යුත්තේ වෛද්‍ය ආඥා පනත යටතේ ස්ථාපිත ...වෛද්‍ය සභාව වන බවත්, එම ලිපියේ සඳහන් වේ.

...වගේ කැමැත්තෙන් පරිබාහිරව සිදු කරන වැඩකටයුතු සමාජ පදනම අර්බුදකාරී ...කට ඇද හෙලන බැවින් රජයේ ස්ථාවරය ශ්‍රේෂ්ඨාධිකරණයට දන්වන ලෙසද

## සයිටම් කරුමය ගැන පියෙකුගේ අඳෝනාව

මෙය ලියන මා කලා උපාධිධාරියෙකු වන අතර, දැනට රජයේ ආයතනයක ලිපිකරුවෙකු ලෙස සේවය කරමි. මා හට දරුවන් 03 දෙනෙකු සිටින, වැඩිමහල් දරුවා දැනට පේරාදෙණිය වෛද්‍ය පීඨයේ 03 වන වසරේ ඉගෙනුම ලබයි දෙවන දරුවා මෙම වසරේ අගෝස්තු මාසයේ උසස් පෙළ ජීව විද්‍යා අංශයෙන් 2 වන වරටත් විභාගය ලිවීමට සූදානම්ව සිටී.

දැනට රටේ පවතින "සයිටම්" ආයතනය පිළිබඳ ගැටලුව හේතුවෙන් විශිෂ්ඨ ගණයේ අධ්‍යාපනික කුශලතාවයක් හා දක්ෂතාවයක් ඇති මාගේ දරුවන් නිදහස් අධ්‍යාපනය පිළිබඳව විශ්වාසයෙන් තොරව අවිනිශ්චිතතාවයකට හා ඉමහත් කලකිරීමකට පත්ව ඇත. වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන දරුවාගේ අධ්‍යාපනය දැනට මාස 06 ක කාලයකට ආසන්නව නතරව ඇත එම කරුණ නිසා වෛද්‍ය පීඨයට ඇතුලත් වීමට ඉතාමත් ආසාවෙන් හා දක්ෂතාවයෙන් සිටින මාගේ 02 වන දරුවාද නිදහස් අධ්‍යාපනය කෙරෙහි කලකිරී උසස් පෙළ විභාගයට දෙවන වරට පෙනී සිටීමට අකමැත්ත ප්‍රකාශ කර සිටී. මේ හේතුවෙන් මා දැඩි මානසික පීඩනයකට ලක්වී ඇති අතරම මා මෙන් ම දැනට මේ හේතුවෙන් මා වැනි දුප්පත් දෙමව්පියන් දහස් ගණනක් ඉමහත් මානසික පීඩනයකට ලක් වී ඇති බව ඉමහත් සංවේගයෙන් දන්වා සිටිමි. වෛද්‍ය විද්‍යාල මුදලට බිහිවීම වලක්වා දුප්පත් බුද්ධිමත් දරුවන්ගේඉගෙනුම අයිතිය ආරක්ෂා කර ගැනීම.

- ආර්.එස්. ජයකොඩි - ඇඹිලිපිටිය

## අධ්‍යාපනයේ අර්බුදය සහ සයිටම්

ගෝලීය ධනපති ආර්ථික අර්බුදය තුළ සුභසාධන ආර්ථික ප්‍රතිපත්තීන් සුනු විසුනු වීමත් සමගම විවෘත ආර්ථිකය නොහොත් නග්න ධනපති ආර්ථිකය ඇතිවිය.ඒ සමග ඇති වූ ගෝලියකරණ ක්‍රියාමාර්ගයන් තුළින් නග්නවම පෞද්ගලීකරණය විවෘත විය.

ධනපති සුභසාධන ආර්ථිකයන් තුළ අධ්‍යාපනය සෞඛ්‍ය ගමනාගමනය ප්‍රධාන වශයෙන්ම ජනතාවට සැපයීමේදී ඒ ඒ රටවල රජයන් පූර්ණ වගකීම දරණ ලදි. එම සේවාවන් ගුණාත්මකවත් සාධාරණවත් ජනතාව වෙත ළඟා කිරීමේ වගකීම රජය මගින් දරනු ලැබිය.ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය හා සයිටම් අර්බුදය වටහා ගත යුත්තේ එවැනි තත්වයක් තුළය.

හැටේ දශකයේ මුල් භාගය වන තුරුම සියළුම උපාධිධාරීනගේ (කලා සහ විද්‍යා) රැකියා සැපයීම ගුරු පත්වීම් ලබාදීම සමඟ බැඳී පැවතුනි. එහෙත් කලා සහ විද්‍යා උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වගකීම රජය මගහරිනු ලැබිය.

විශේෂයෙන්ම 1977 න් පසුව ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හේතු කොට ගෙන විශේෂයෙන්ම ගණකාධිකරණය වැනි විෂයයන් බොහොමයක් පෞද්ගලික අධ්‍යාපනයට පමණක් සීමා විය. මෙලෙස අධ්‍යාපනය මුදලට විකිණෙන සේවාවක් බවට පත්වනු ලැබීය.

ජාතික පාසලකට හෝ ප්‍රධාන පාසලකට තම දරුවකු ඇතුළු කර ගැනීම සාමාන්‍ය වැසියෙකුට කළ නොහැක්කක් විය. ජාතික පාසල්වලට සහ ප්‍රධාන පාසල්වලට ශිෂ්‍යයකු ඇතුළත් කරගැනීමේදී ප්‍රමුඛස්ථානය දෙන දෙමාපියන් ගේ ආදි ශිෂ්‍ය භාවය සහ වෘත්තීය භාවය සුදුසු කමක් ලෙස සලකන නිසාම සමාජ ස්ථර භාවයේ පහල තට්ටු වල ජනයාට එම පහළ ස්ථර භාවයේ සිටීමටම බලකරනු ලබන නිසා සම්පත් අතින් උසස් තත්වයේ පැසැලකට දරුවකු ඇතුල්කර ගැනීමට නොහැකි වී තිබේ. ධනපතියන් වෘත්තිකයන් තම ළමුන් උසස් පාසල්වලට ඇතුළත් කරගනු ලැබුවත් එම පාසල් මායිමේ ජීවත් වන කම්කරුවකු හෝ ගොවියකුගේ දරුවකුට උසස් පාසලකට ඇතුල්වීම වලකා ඇත.

රජයේ විශ්ව විද්‍යාල තුළ නොයකුත් ගැහැට විඳිමින් පිරිසකට අධ්‍යාපනය ගෙන යෑමට අවස්ථාව සැලසුනත් එම සුදුසුකම්ම පවතින වැඩි පිරිසකට විශ්ව විද්‍යාල වරම් නොලැබීම හේතු කොට ගෙන අනාථ වී ඇත. යන්තම් හෝ හැකියාවක් ඇති පිරිස විදේශ විශ්ව විද්‍යාල පිහිටුවා ඇති අනුබද්ධ ආයතන මගින් උපාධි ලබාගන්නා අතර දේශීය විශ්ව විද්‍යාල මගින් ලබාදුන් බාහිර උපාධියද දැන් නවතා දැමීමට සූදානම්වේ.

- සිරිමල් පීරිස් -

# ආසියාවේ "හොඳම මුදල් අමාත්‍යවරයාගේ" කෙළි එළිවෙයි



පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු නාරංග මාලසූරිය මහතා

ගරු සභාපතිතුමනි, අපගේ නව ජනමාධ්‍ය හා මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මහතා විසින් ඉදිරිපත් කර ඇති සුරාබදු ආඥා පනතට අදාල දැනුම්දීම් දෙක පිලිබඳව මගේ අදහස් දක්වමි. පලමුව මම නව අමාත්‍යතුමාට සුභ පතමි. ඒ පිලිබඳව අනාවැකි පුවත්පත්වලින් දුටු විට මා ඔහුට මතක් කර දුන්නේ ද්වේශසහගතව හා නිස්සාරව කටයුතු නොකරන ලෙසටත්, තනතුරට අදාල ගරුත්වය අනුව කටයුතු කරන ලෙසත්ය. නැවතත් මම එම කරුණ අවධාරණය කරමි.

**ආසියාවේ හොඳම මුදල් අමාත්‍යවරයා**

ගරු සභාපතිතුමනි, මුදල් අමාත්‍යාංශයේ පවතින බැරෑරුම්කම ගැන මහබැංකු වාර්තාවේ සඳහන් කරුණකට අදාලව ඔබගේ අවධානය යොමු කරවමි. මේ පිලිබඳව 2016 අයිලන්ඩ් පුවත්පතේ පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අංශයේ මහාචාර්ය මිල්ටන් රාජරත්න මහතා විසින් ආර්ථික දත්තයන් 30ක් 2014 මහින්ද රාජපක්ෂ රජයේ කාලය සමඟ සන්සංදනාත්මකව ඉදිරිපත් කර ඇත. එයින් කරුණු 28ක්ම පෙන්නුම් කරන්නේ ආර්ථිකයේ පහත වැටීමය. කරුණු දෙකක් පමණක් සාර්ථකත්වයක් පෙන්නුම් කරයි. එයද ආසන්න වශයෙනි. මෙහිදී ඒකපුද්ගල ආදායම සලකා බැලීමේදී පසුගිය වසරේ ආසියාවේ හොඳම මුදල් අමාත්‍යවරයාගේ කළමනාකරණයට අනුව, ඊට පෙර වසරට වඩා ඩොලර් 8ක අඩුවීමක් පෙන්නුම් කරයි. එය 2014 සමඟ සසඳා බලන කල ඩොලර් 14ක අඩුවකි. හිටපු මුදල් අමාත්‍යවරයා ලංකා සතොස භාර ගෙන කළ හර්යම නැවත සිදුකර මුළු රටම පහලට ඇදදමා තිබේ. එපමණක් නොව 2014 සමඟ සසඳන විට ඉලක්කම් සැකසහිත ලෙස වර්තමාන ආණ්ඩුව සකසා ඇති බවද පෙන්වා දෙනු කැමැත්තෙමි.

**ආර්ථිකයේ බිඳ වැටීම**

2014 සමඟ සසඳා බලන කළ ආර්ථික සංවර්ධනය ප්‍රතිශතයක් ලෙස බිඳවැටී තිබේ. දල දේශීය නිෂ්පාදනය බිඳවැටී ඇත. දල දේශීය ආදායම අඩු වී ඇත. විරැකියාව ඉහල ගොස් තිබේ. පාරිභෝගික මිල දර්ශකය ඉහල නැඟ තිබේ. සමස්ථ වැටුප් දර්ශකය පහත වැටී තිබේ. වෙළඳ ශේෂයේ හිඟය ඉහල ගොස් ඇත. විදේශ විනිමය ඉපැයීම් පහල බැස ඇත. මෙහි ඉතාමත් බැරෑරුම් කරුණ නම් 2017 පලමු කාර්තුව තුල ආර්ථිකය පහත බැස ඇති ආකාරයයි. අවුරුදු 2 ඇතුලත දිගටම අපගේ අපනයනය පහත බැස තිබේ. ආනයන වියදම 2014 හා සසඳන කල වැඩිවී තිබේ. රජයේ ආරක්ෂිත සංචිත අඩුවී තිබේ. ණය ලබාගැනීම ගැන කියන කථා මොනවාද? ණය සේවා ප්‍රතිශතය 2014 සිට 2016 දක්වා 20% සිට 25% දක්වා ඉහල ගොස් තිබේ. රජයේ ණය ප්‍රතිශතය අසන්න අවුරුදු දෙක ඇතුලත දල දේශීය නිශ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 71% සිට 79% දක්වා වැඩිවී තිබේ. අනෙක් දර්ශකයන් වන රජයේ වියදම් හිඟය, පොලී අනුපාතය සහ ණය ගැනීමේ දර්ශක ආදිය පෙන්නුම් කරන්නේ රාජ්‍ය ආර්ථික පදනම බිඳවැටෙමින් පවතින බවය. කොළඹ කොටස් වෙළඳපොල හා විදේශීය සෘජු ආයෝජන නොලැබීම් වලින් ද ආර්ථිකයේ අස්ථාවර භාවය මනාව පෙන්නුම් කරයි.

**භයානක වටපිටාවක්**

මෙම බැරෑරුම් තත්වය නව මුදල් අමාත්‍යවරයාගේ අවධානයට භාජනය කර මතුවී ඇති භයානක වටපිටාව වටහා ගත යුතුවේ. ගරු මුදල් අමාත්‍යවරයා මෙම ආර්ථික දර්ශක වසරෙන් වසර සසඳා බලමින් ලංකා ඉතිහාසයේ මෙවැනි දුර්භාග්‍ය සම්පන්න වකවානුවක් පැවතියේද යන්න අප වෙත දන්වන ලෙස ඉල්ලමි. මහබැංකුවේ ඉලක්කම්වල පවතින සැකසහිත තත්වය තිබියදී වුවද එම වාර්තාවෙන් මෙම දර්ශකයන් උපුටා



ගෙන ඇති බව සභාවේ දැඩි අවධානයට යොමු කරමි. 2016 දෙසැ. 31 ට නිකුත් කළ මුදල් ප්‍රකාශය ගැන විගණකාධිපතිගේ මතය අවශ්‍ය වෙනවා. ලංකාවේ පලමු වතාවට විගණකාධිපතිවරයා මූල්‍ය ප්‍රකාශය පිලිබඳව තම මතය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කර තිබේ. ඔහුගේ ප්‍රකාශය වී ඇත්තේ '' එම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ විස්තර කරන කරුණු පිලිබඳව මට ප්‍රමාණවත් විගණන සාක්ෂි නොමැතිව මතයක් ප්‍රකාශ කළ නොහැකි බවත් එනිසා මෙම මුදල් ප්‍රකාශය පිලිබඳව මගේ මතයක් ප්‍රකාශ නොකරමි.'' යනුවෙනි.

**බැඳුම්කර නිකුතුවේ වගකීම්**

නව ඇමතිවරයාගෙන් මේ පිලිබඳව බරපතලව සිතාබලන ලෙස ඉල්ලමි. සාමාන්‍යයෙන් බැඳුම්කර නිකුතුවක් මුදල් අමාත්‍යාංශයෙන් සිදු කිරීමට අවශ්‍ය විට ඒ පිලිබඳව චක්‍රලේඛයක් මගින් බර්ක්ලේස්, මෙරිල් ලෙව්, සිටිගෘප්, එච්එස්බීසී වැනි ජාත්‍යන්තර ආයෝජන බැංකුවලට දැනුම්දීම් කරනු ලබයි. එම චක්‍රලේඛයෙන් නිශ්චිත තොරතුරු දැක්වීම මහ බැංකුවෙන් සිදු කරයි. ''සියලුම සාධාරන විමසීම් සිදුකර ඇති බව හා එකී නිකුතුව සඳහා සියලුම තොරතුරු අඩංගුව ඇති බවට සහතික වෙයි.'' මෙහි ඇති බරපතලකම වටහා ගත යුතුයි. හිටපු මුදල් අමාත්‍යවරයා බොරුකර තිබේ. මහ බැංකු වාර්තාවේ තොරතුරුවල සත්‍යතාවය ගැන විගණකාධිපති තුමාට සෑහීමකට පත්වීමට නොහැකිවී ඇත. එනිසා විදේශීය ආයෝජන බැංකු මහබැංකුවේ වාර්තාවල විනිවිදභාවය පිලිබඳ සැකසහිත තත්වයක් ඇති කර ගැනීම නොවැලැක්විය හැකිය.

**විගණකාධිපති තුමා සෑහීමකට පත්නොවේ**

මේ හේතුව නිසා ශ්‍රී ලංකා රජයට අනාගත වෙන්දේසි වලදී, වඩා වැඩිපුර මිලක් ගෙවීමට සිදුවේ. එපමණක් නොව මෙහි ප්‍රතිඵලයක් ලෙස දල දේශීය නිෂ්පාදිතය හා ණය අනුපාතය ව්‍යාජ ලෙස සකස් කිරීමෙන් කලින් තිබූ බැඳුම්කරවල මුහුණත වටිනාකම හා අමාත්‍යවරයා විසින් සකස් කළ වටිනාකම් අතර වෙනසක් මතුවේ. එය පෙන්නුම් කරන්නේ දල දේශීය නිෂ්පාදිතයට සමානව ණය දර්ශකය 79% වුවත් ඇත්ත ඉලක්කම 83%කට වැඩිවිය හැකි බවය. මේ පිලිබඳව අමාත්‍යවරයා ගණනයක් කර නිශ්චිතව එය කුමන ප්‍රමාණයක්ද යන්න සොයා බැලිය යුතුය. මේ නිසා ශ්‍රී ලංකාවේ ඇදි ඇදී යන ආර්ථිකයට වැඩිපුර බරක් මේ සතියේ විදේශීය ණය ගෙවීම්වලට එකතුවේ. එය වාර්ෂිකව ඇ.ඩො.බිලියන තුනක ප්‍රමාණයකි. මේනිසා අමාත්‍යවරයාට ආර්ථික ස්ථාවරත්වය තහවුරු කිරීම අපොහොසත්වීමත් විදේශ සෘජු ආයෝජන ලබා ගැනීමට නොහැකිවීමත් නිසා පොරොන්දු වූ යහ පාලන ආණ්ඩුව වෙනුවට අපව විප්ලවකාරී පියවරකට මෙහෙයවෙනු ඇත.

**ඥාති සංග්‍රහය නුසුදුසු පුද්ගල සැළකීම්**

මා අමාත්‍යවරයාගෙන් නිහතමානීව ඉල්ලා සිටින්නේ මීලඟ අයවැයේදී මිතුරන් ඉලක්ක කර ගෙන යෝජනා සැකසීම නොකළ යුතු බවය. එවැනි කරුණු රාශියක් 2016 අයවැයේදී දැකගත හැකිවිය. එසේම ගරු අමාත්‍ය තුමනි විවිධ පුද්ගලයින්ගෙන් මුදල් කුලියට ගැනීම මෙන්ම කිසිම බන්ධිත ගබඩා සංකීර්ණයක් තමන්ගේ ලඟ ඥාතීන්ට බදුදීම හෝ නුසුදුසු ඥාති පුද්ගලයින් රාජ්‍ය ව්‍යාපාරවලට යෙදවීම සිදු නොවිය යුතුය. එවැනි දිග ලැයිස්තුවක් මා සතුව ඇත. මා පෙන්නුම් කරන කරුණුවලට සැලකීමක් ඇත්නම් හිටපු මුදල් අමාත්‍යවරයාට වඩා නව අමාත්‍යවරයා යම් වැඩකොටසක් කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි. ඔහුට ලැබුණු සපත්තුව ලොකු වැඩි බව කියා තිබුණි. ගරු ආචාර්ය එන්.එම්.පෙරේරා හෝ ගරු රොනිඳ මැල් මැතිතුමාට තරම් බුද්ධිමත් හැකියාවක් ඔබට නැතිවිය හැකිය. එහෙත් හිටපු අමාත්‍යවරයාට වඩා ඔබ විවේචනයට ඇහුම්කන් දෙතැයි විශ්වාස කරමි.

**(2017 ජූනි 22 දින පාර්ලිමේන්තුවේ කළ කථාව ඇසුරෙන් සකසන ලදි.)**

**- සිරිසුමන -**

# කවි සිතුවිලි

## අසිපත

දැන් දෙවසර අවසන් පල කරපු වැකි
දවසින් දවස යයි යහ පාලනය මැකී
වෙනසක මහා බල මහිමය සිහින දකී
කණ කැස්බෑවා විය සිදුරෙන් සිහින දකී

සම් මස් ඇට නහර කා රුධිරය බොන්න
දුගියගෙ දුබලයගෙ ගෙල මිරිකා ලන්න
ධනපති රදල බල මුළු රැළ රැක ගන්න
බැහැ තව හොපිට මේ විදියට ඉඩ දෙන්න

ඇටකටු උලා කන පිරිසක් වල් මූරු
දුමණ පගා ගැන ගහනව කයිවාරු
ජේ.වි.පී. එකේ රතු අලිවික ඔබගෝරු
යහපාලා ගාගෙන වර්වස් චෝරු

රට රටවලට යන ජනපති නිගාසකා
පව වච්චෝරු ඇද බාමින් පාළුමකා
ඡන්දය කල්දමා ජනමතයට පිටුපා
මක බෑ වෙලා පලයන් යහපාලනේ යකා

**ඇහැලියගොඩ - සේන සෙනෙවිරත්න**

## අපි මුණ ගැසෙමු.

නැණ සව් සිහින මිණිසුන් ලෙස සිතන්නට
හුරු නොමවුණොත් වෙයි සැම දින හැවෙන්නට
විරිය නොකළහොත් යහපත කරන්නට
සිදුවෙයි සැමදිනේ කඳුළින් තෙමෙන්නට

කම්පාවෙමින් සිහිපත්කොට ගෙවුණු යුගේ
ඒ යස ඉසුරු සිහිණෙන් ගෑ සුවඳ වගේ
පාවෙන අරමුණක් නොමැතිව ගලන ගඟේ
බරුවකි රුවල ගිලිහුණු ජිවිතය මගේ

ලස්සන හැම දෙයම තිබුනත් නෙතට හුරු
ඒ හැම දෙයම හා ඔබ සම කෙරුම බොරු
මම මඟ බලමි ඔබෙ පිළිතුරු ලැබෙන තුරු
මින් සමු ගනිමි යළි අපි මුණ ගැසෙන තුරු

**මණ්ඩාරවෙල - දිනේෂ කුමාර මණ්ඩාර**

## පොදු ජන අදෝනාව

ආවේ යස ඉසුරු සහ සාමය දෙන්න
දැන් සිදු වුනේ පිවන ගඟ බිලිවෙන්න
බැහැ තව තොපේ බර රටකට උහුලන්න
මක බෑවෙලා පලයව් යකුනේ යන්න

වැඩි වේදනා එති කිමුලා කෑව විට
හිරිවැටෙනවා ගැවුන විට කොහිල පිට
පොදු ජන හඬට කන් නොදෙනා නරකුන්ට
ගොන් කවනීම නොටාපන් මේ වාහෙලට

**-හොරම්බාව පද්මදාස -**

## සැලෙන නිදිකුම්බාව

මහළු මවකගේ - ළය තෙත්බව
හද උතුරා යන - කරුණාව පිරි
නිසංසල උඳුපියලිය - නොමුවේම
හැදී වැඩුණු - ප්‍රතාපවත් රුදුරු
කටුවලින් හෙබි - නිදි කුම්බාව
සන්කල පමණින් වුව - හැකි ගන්නේ ඇයි

**මංගල විජේසිංහ**

# පොල් වගාවේ විපත්තිය

## පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නවාවි මැතිතුමා



රාජ්‍ය පොල් ඉඩම් කොම්පැනිවලට දීලා පරිහානියට පත් වුනා. කොම්පැනි කාරයෝ වතු ගත්තත් පොල් වගාව වැඩිදියුණු කළේ නැහැ. පොල්ගස් කපා ගත්තා. පොල් හිටෙව්වේ නැහැ. මේ නිසා හලාවත, පුත්තලම ප්‍රදේශයේ පොල් තෙල් හා කොප්පරා මෝල් සිය ගණන් වසා දමලා. නිශ්පාදනයන් නැහැ. රැකියාවලුත් නැහැ. අපනයනයත් නැහැ. දැන් අපි බොහෝ අහිතකර තෙල් වර්ග ආනයනය කරනවා.

පොල් කිරි සහ ගාපු පොල් ටින් කරලා, පැකට් කරලා ඉහල වියදම් දරණ පංතියේ පරිභෝජනයට සකස් කරනවා. මෙයින් පහර වැදුනේ දුප්පත් මිනිස්සුන්ට. රාජ්‍ය ඉඩම් අක්කර දහස් ගණන් කොම්පැනිවලට පලමුවෙන්ම දුන්නේ යූ.එන්.පී. ආණ්ඩුවයි. 1977 පසු දෙවනුව චන්ද්‍රිකාගේ ආණ්ඩුව එම ඉඩම් වසර 70 කට ඒ කොම්පැනිවලට දුන්නා.

මේ නිසා වසරේ පොල් හිඟ කාලය වූ පෙබරවාරි මාර්තු මාසවල පොල් ගෙඩියක මිල රු. 50 වෙනවා. මෙවර එය රු. 80 ට ගිහින් තිබෙන්නේ රුපියලේ වටිනාකම වැටීමත්, බදුබර වැඩි වීමත්, ජීවන වියදම වැඩිවීමත් නිසාය. මිල මුදල් වියදම් කල හැකි අයගේ ඉහල ඉල්ලුම සහ පොල් නිශ්පාදනයේ පහල සැපයුමද මෙයට හේතුවන බව මන්ත්‍රී නවාවි මැතිතුමා පාර්ලිමේන්තුවේදී පැවසීය.

# රාජ්‍ය විශ්‍රාමිකයෝ ද "මනුෂ්‍යයෝය"

මහජන සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනයත්, ප්‍රගතියත්, මිනිසාගේ ජීවන මට්ටමේ අභිවෘද්ධියත් හේතුකොටගෙන මිනිසාගේ පරමායුෂ ද ඉහළ යාම නිසා රාජ්‍ය විශ්‍රාමික ගහණය ද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. ඒ අනුව මේ වන විට රාජ්‍ය විශ්‍රාමික සංඛ්‍යාව ලක්ෂ හයකට ආසන්න වී ඇත.

රාජ්‍ය පාලනය මෙහෙය වන ඇතැම් මැති ඇමති තුමන්ලාගේ සහ ආර්ථික උපදේශනයේ නියැලෙන ඇතැම් විද්වතුන්ගේ ප්‍රකාශ, තීන්දු තීරණයන් මැද, වත්මන් විශ්‍රාමිකයාට මුහුණු පෑමට සිදුව ඇති ගැරහීම්, කෙනහිලිකම්, නොසලකා හැරීම්, අහිමි කිරීම් පිළිබඳව ඔබතුමන්ලා සියලු දෙනාගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු. ගරු මැති ඇමති තුමනි, නිළධාරිවරුනි, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ V හා VI පරිච්ඡේදය මගින් ද, 1978 ව්‍යවස්ථාවේ III හා VI පරිච්ඡේද මගින් ද ප්‍රකාශිත මූලික මිනිස් අයිතිවාසිකම් හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ මූලධර්ම මගින් රටේ පරිමාධිපත්‍යයේ එකම හා උත්තරීතර හිමිකරුවන් වන ජනතාව විසින් එක හා සමානව භුක්ති විඳිය යුතු අයිතිවාසිකම් වර්ථෝරුගත කරමින්, මොන හේතුවක් මත හෝ කිසිදු කෙනෙකු වෙන්කොට සැලකීම හෝ කිසිදු කෙනෙකුට වෙනස් ලෙස සැලකීම නොකල යුතු බවට තහංචි පනවා ඇත්තේ ද ඔබතුමන්ලාමය. එසේම ඒ උතුම් නීති රෙගුලාසි ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොකර, ඒවා අති සුන්දර වචන වලින් සරසා නීති පොත තුළම පමණක් ප්‍රාදූර්භූත කිරීමට කටයුතු සලසා ඇත්තේ ද ඔබතුමන්ලාමය. ඒ බැව් මෙහි පහත දැක්වෙන කරුණින් පැහැදිලි වනු ඇත.

"2016 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2016/03 මගින් රජයේ සේවක මූලික වැටුප රු. 10,000රැ කින් වැඩි කරමින් එම චක්‍ර ලේඛයේ 05 02 ජේදයෙන් එම වැටුප් සංශෝධන, විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්යයන් සඳහා බල නොපාන බවට තහනම් නියෝගයක් ද පනවා ඇත."

එම නිසා ඔබ සියලු දෙනාගේ සුවිශේෂී අවධානය මේ කෙරේ යොමු කොට, තම ජීවිතයේ ජවසම්පන්නම අවධිය දේශයේ උන්නතිය වෙනුවෙන් කැපකර දැන් අබල දුබලව විශ්‍රාමිකව සිටින මේ පිරිසට ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබාදීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

**එම්.ආනන්ද විමලවීර මහතා**
**කුරුණෑගල දිස්ත්‍රික් රාජ්‍ය හා**
**පළාත් පාලන සේවා විශ්‍රාමිකයින්ගේ සංගමය**

# කම්කරු නිවාස වලින් මෙගා පොලිසි ගසාකෑමක්

මීට වසර තුනකට පෙර මහින්ද රාජපක්ෂ ආණ්ඩුව යටතේ, නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත් වීම මත කම්කරුවන් දශක ගණනක් රැඳී සිටි හලාවත බස් නැවතුම්පල අසල ඉඩමෙහි වූ පැල්පත් නිවාසවලින් ඔවුන් ඉවත් කරන ලද්දේ අලුතින් නිවාස තනා දෙන පොරොන්දුව මතයි. එම ඉවත් කිරීම් යටතේ දෙස් විදෙස් ධනපති ආයෝජකයන් සඳහා කොළඹ ඇතුලු හා අවශේෂ නාගරික ප්‍රදේශවල වටිනා ඉඩම් ලබාදීම වත්මන් සිරිසේන වික්‍රමසිංහ ආණ්ඩුව ''මෙගා පොලිස් ව්‍යාපෘතිය'' ලෙස ක්‍රියාත්මක වන්නේද එම වැඩපිළිවෙලයි.

හලාවත නගර මධ්‍යයේ පිහිටි හෙක්ටෙයාර් භාගයක් පමණ වූ එම වටිනා ඉඩමෙන් ඔවුන් ඉවත් කිරීමෙන් පසු නගරයේ සිට කිලෝ මීටර් 02 ක් පමණ නැගෙනහිර දෙසින් පිහිටි නරියගොඩැල්ල නම් වගුරු බිමක් වෙන් කෙරුණි. කම්කරුවන්ගේ ද ශ්‍රම දායකත්වයෙන්ද යුතුව කිසිදු ප්‍රමිතියකින් තොරව නිමවූ මෙම නිවාසවල පදිංචිව සිටින මුලු කම්කරු පවුල් සංඛ්‍යාව 57 කි. එක් නිවසක් සඳහා වැය වූයේ යයි කියන රුපියල් 915,148/ ක මුදල කම්කරුවන්ගේ වැටුපෙන් කපා ගැනීමට සූදානම් වන අතර එයට කම්කරුවන් විරෝධය දක්වමින් ඇත.

# අවස්ථාවාදීයෝ යහපාලනයට පවන් සලති.

වර්තමාන ආණ්ඩුව පිලිබඳව කොමියුනිස්ට් පක්ෂයේ ස්ථාවරය ඇත්ත පුවත්පත මගින් විවිධ ආරූඩ නම්වලින් පලකරන ලිපිවල එලිදක්වමින් තිබේ.

පසුගිය සති අන්තයක පළ කළ ඇත්ත පත්‍රයේ උද්ධෘත මෙසේ විය. "අද විපක්ෂ කණ්ඩායම් අතිශයින් දුර්වලය. විපක්ෂයට බලය ලබාගත හැකි මතවාදයක් රටතුල නැත. මහින්ද රාජපක්ෂ ස්වයං විවේචනයක් කර නැත. ජනතාව ජනවාරි 8 ට පෙර තිබූ තත්ත්වයට යාමට සූදානම් නැත." මෙයින් නොකියා කියන්නේ පුද්ගලීකරණය කරපින්නා ගත්, ජන ජීවිතය විනාශ කළ අධිරාජ්‍යවාදී බටහිර බලවේග සමඟ හවුල්කන ජනතා ද්‍රෝහී සිරිසේන -වික්‍රමසිංහ රජය පවත්වාගෙන යා යුතු බවය. මේ පිලිබඳව කොමියුනිස්ට් පක්ෂයේ වැඩබිම් නියෝජිතයෙක් ප්‍රකාශ කලේ "පක්ෂය හැර ගිය යහපාලන පිරිස් නැවත පක්ෂයට කඩාවැදී ලේකම්වරයා යටපත් කරගැනීමෙන් පවතින ආණ්ඩුවේ වාසිලබාගැනීම සඳහා අවස්ථාවාදීව ක්‍රියාත්මක වන බවය. ඒත් සැබෑ කොමිනියුස්ට්වරුන් ඒකාබද්ධ විපක්ෂයත් සමඟ අත්වැල් බැඳගනිමින් යහපාලනය පරාජය කිරීමට පෙරමුණ ගන්නවා. පක්ෂයේ දෙබිඩි තත්වය මීලඟ සමුළුවෙන් පසුව අවසන් කිරීමට පාක්ෂිකයින් සූදානමින් සිටිනවා." යනුවෙන්ද ඔහු පැවසීය.

# උමා ඔය වරද කාගෙ ද ?

උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කළේ මහින්ද රාජපක්ෂ රජය යි. එහි උතුම් අරමුණ වූයේ වියැලෙන වෙල්ලස්සට ජලය රැගෙන යාම යි. ඔවුහු බලයේ සිටියදී ඒ කටයුත්ත නිසි අධීක්ෂණයකින් යුතුව කාර්යක්ෂමව ඉටු කරමින් සිටියහ. එහෙත් යහපාලන සමය එළඹීමත් සමග සියල්ල කණපිට හැරුණි. පසුගිය මහින්ද රාජපක්ෂ රජයට දෙස් දෙවොල් තබනු හැර යහ පාලකයන්ට වෙන වැඩක් තිබුණේ නැත.

ජලය ගෙන යන උමං කැණීමේ ශාස්ත්‍රයේ අයනු ආයනු යනු ජල කාන්දු වහා වසා දැමීම යි. එයට ගැලපෙන යන්ත්‍ර මිලදී ගැනීමයි. දැන් සිදුවී ඇත්තේ ලාබ හා නොදැනුවත් පිරිස් යොදා උමං හෑරීම නිසා සිදුව ඇති විනාශයයි. පළමුවෙන් ම අවධානය යොමු විය යුතු කරුණ වන්නේ භූ ගත ජල කඳ ඉතා සුලු කාන්දුවක් ඇති තැනකට වුව ද වහා ඇදී විත් සැණෙකින් මහ ජල කඳක් බවට පත් වීමේ අවධානමයි. පසුගිය රජයේ කළ සියලු වාරි ව්‍යාපෘතීන්හිදී ජල කාන්දු වහා වසා දැමීම කඩිනමින් සිදු කෙරිණි. පසුගිය අවුරුදු දෙකහමාර තුළ නිදි කිරමින් බණ්ඩාරවෙලට හෙණ ගෙනැවිත් දුන්නේ යහපාලකයන් බවට ගැලවීමක් නැත. එහෙයින් විපතට පත බණ්ඩාරවෙල හා අවට ගම්වාසීන්ට වන්දි හා විකල්ප ඉඩම් වහා ලබා දීමේ වගකීමෙන් ගැලවීමට යහපාලන යම පල්ලනට නොහැකි ය.

# අපගේ ශෝකය

රත්නපුරය වේවැල්වත්ත, ඇස්වැද්දුම පදිංචිව සිටි එල්.එම්.පුංචිමැණිකේ දයාබර මෑනියන් පසුගිය දිනක අභාවයට පත් වුවාය. ඇය ඇතුලු පවුලේ අය සැමදා වාමාංශික ව්‍යාපාරයට සහයෝගය දැක් විය.

**කරඳන, යටිපව්ව, පැලවත්ත පදිංචිව සිටි ගුණසිංහ පතිරආරච්චි සහෝදරයා පසුගියදා අප අතරින් වෙන් විය.**

අප පක්ෂයේ සංවිධායක ලේකම් එම්.එස්.ප්‍රනාන්දු සහෝදරයාගේ මාමන්ඩිය වූ කටුපොත ස්වශක්තිගම විසූ ආර්.එම් අප්පුහාමි මහතා පසුගිය දින අප අතරින් වෙන් විය.

**ප්‍ර.වා.පෙ. අගලවත්ත සංවිධායක අනුර පොල්ගම්පල සහෝදරයාගේ නිවිතිගල පාර මැටිගෙදර විසූ ආදරනීය නැන්දනිය පසු ගිය දිනක අභාවයට පත් විය.**

ප්‍ර.වා.පෙ. තංගල්ල සංවිධායක පද්මසිරි ගාර්දිවසම් සහෝදරයාගේ ඥාති පුත්‍රයෙකු වන රවිඳු නිම්සර ගාර්දිවසම් සහෝදරයා තංගල්ල පහලගොඩදී හදිසි අනතුරකින් අභාවයට පත්විය.

**ඉහත අභාවයන් පිලිබඳව අපගේ සංවේගය පලකරමු.**


# ශක්තිය පුවත්පතට ආධාර කරන්න

මූල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවීමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබා දෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබා දෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන ආකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරුකරගත හැකි වන පරිදි එවන්න.



සරත් පද්මදාස
කලමණාකරු
ශක්තිය
49/1, විනයාලංකාර මාවත,
කොළඹ 10.
දුර/ෆැක්ස් : 011 2684820

# ශක්තිය

## සමන් කුමාර සහෝදරයා වහා නිදහස් කරව්.

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්ජනයේ නියුතු ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් බන්දුල සමන්කුමාර සහෝදරයා ඇතුළු අනෙකුත් වෘත්තීය සමිති නායකයින් සාකච්චාවක් අවසන් කර පිටතට පැමිණෙන විට සංස්ථා දොරටුව අසලදී පොලිසිය හා මැරවරයන් විසින් පහර දෙමින් අත්අඩංගුවට ගෙන ඇත. වහා ඔවුන් නිදහස් කරන ලෙස වෘත්තීය සමිති සංවිධාන රජයට බල කර සිටී.

### සයිටම් වසා දැමීම, රාජ්‍ය සේවක විශ්‍රාමය රැකගැනිම හා ඡන්දය ලබා ගැනීම සඳහා බලකරන

# ජාතික විරෝධතා දිනය අගෝස්තු 02 තීන්දු කරයි







සයිටම් විරෝධී ජන පවුර ජාතික සමුළුව පසුගිය ජුලි 25 වන දින පැවත්වූ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කැඳවීම අනුව දේශපාලන පක්‍ෂ බහුජන සංවිධාන හා වෘත්තීය සමිති නියෝජිතයන් විශාල පිරිසක් පෙලපාලි වලින් පැමිනෙමින් සහභාගී වූහ. එහිදී ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තු නායක දිනේෂ් ගුණවර්ධන හා වාසුදේව නානායක්කාර සහෝදරයා අදහස් දැක්වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම මැතිතුමා ඇතුළු ඒකාබද්ධ විපක්‍ෂයේ මන්ත්‍රී වරු පිරිසක් ද සහභාගී වූහ. මෙහිදී ජාතික විරෝධතා දිනයක් පැවැත්විය යුතු බවට ඒකමතිකව තීරනය විය.

වැඩබිම පුවත් සංස්කරණය **මිසුරි කුලසූරිය**

## අවිස්සාවේල්ලේ ඇපරල් සේවකයින්ට ජාත්‍යන්තර චැලේන්ජ් එකක් !

ඒකාබද්ධ මැයි රැළියට සහභාගී වීමට සූදානම් වී සිටි අවිස්සාවේල්ලේ ඔරිට් ඇපරල්ස් හි සේවක මණ්ඩලයට මැයි 1 වන දා නිවාඩු ලබා දීම එහි පාලක මණ්ඩලය ප්‍රතික්ෂේප කර ඇති බැව් වාර්තා වේ.

ලෝක කම්කරු දිනය සැමරීම සඳහා මැයි දින නිවාඩුව ප්‍රකාශයට පත් කරමින් 2 වන ජාත්‍යන්තරයේ 6 වැනි සමුළුව විසින් 1904 දී ඇම්ස්ටර්ඩෑම්හි දී සම්මත කර ගන්නා ලද ඓතිහාසික කම්කරු අයිතියට ගරහමින් ඔරියන්ට් ඇපරල්ස් ලොක්කා මෙලෙස අභියෝග කරන්නේ වර්තමාන කම්කරු විරෝධී ආණ්ඩුව යටතේ ගිනු මතේ කොම්පැනිකරුවන්ට ලැබී ඇති හයිය නිසා බව ඇපරල් සේවකයෝ ප්‍රකාශ කරති.

## විදුලියටත් අකුණු වදින ලකුණු
## ලංවිම සේවකයොත් වැඩ වර්ජනයට ලෑස්තියි

ජාතික සම්පත් කුණුකොල්ලයට විකුණා තම එදා වේල සරිකර ගන්නා තැනට පත් වී ඇති මේ බංකොලොත් යහපාලන ආණ්ඩුව විදුලි බල මණ්ඩලයත් කොටස් කර විකුණා දැමීමේ දුෂ්ට ප්‍රයත්නයක නිරත ව සිටී. මේ භයානක අනතුර කල් තියා දැනහඳුනාගෙන සිටින විදුලි සේවක වෘත්තීය සමිති පසුගිය දා විහාර මහා දේවී උද්‍යානයට රැස් වී සටන් තීන්දු ගෙන ආණ්ඩුවට අවසන් නිවේදන නිකුත් කර තිබේ.

## අයවැයේ 2500/- ඉල්ලූ රාමචන්ද්‍ර රස්සාවෙන් දොට්ට !

පසුගිය අයවැයෙන් සේවකයනට ලබා දුන් රුපියල් 2,500 සහන දීමනාව ඩිල්මා ග්ලාස් ආයතනයේ මෑන් පවර් සේවක කණ්ඩායමට මේ වන තෙක් ලැබී නොමැත. මෙම සහන දීමනාව තම සේවක මණ්ඩලයට ලබා ගැනීම සඳහා දිගින් දිගටම ඉල්ලීම් කළ රාමචන්ද්‍ර සහෝදරයාගේ රැකියාව අහිමි කිරීමට ඩිල්මා ග්ලාස් පාලකයන් සාහසික වී ඇති බැව් "ශක්තිය" ට වාර්තා වේ.

## වෛද්‍යවරුන්ට එරෙහිව "ප්‍රා" කල්ලි සූදානමක් ?

තම රැකියා පමණක් නොව ජීවිත පවා බලවත් අවදානමකට ලක් කරමින් මේ දිනවල රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ජනතාව වෙනුවෙන් ගෙන යන අරගලය පසුපස කුප්‍රකට "ප්‍රා" මැර කල්ලි හඹායමින් සිටින බවට ඉඟි තැනින් තැනින් මතු වෙමින් පවතී.

පසුගිය දා මීගමුව රෝහල් පරිශ්‍රයේදී වෛද්‍යවරුන්ට තර්ජනාංගුලිය ඔසවමින් අසභ්‍යපය විසිකොට බැනවදිමින් මැරයෙකු කළ රංගනය මෙයට කදිම උදාහරණයකි. බේත් ගන්නට රෝහලට පැමිණි ලෙඩෙකු ලෙස රජයේ හොරණෑ මාධ්‍ය අර්ථ ගන්වන්නට උත්සාහ කළ ද ඔහුට ඉහෙන් බහින රෝගයක් නොතිබූ බව ඔහුගේ සංදර්ශනය රූපවාහිනියෙන් නැරඹූ ජනතාව කියා සිටිති.

ඉතිහාසයේ දියත් කෙරුණු ජනතා අරගල දේශපාලන මැර බලය යොදවා තලා පෙළා සමතලා කර දැමීමේ නින්දිත ඉතිහාසයක් ඇති "ප්‍රා" කල්ලිය මෙහෙය වූ මැරයන් ඡන්දයෙන් පාලකයන් වී සිටියි. රට ගිනි ගෙන තිබියදී යුක්ති සහගත පිලියමක් සොයනවාට වඩා රූපවාහිනී චැනල්වලට ඒ කට මැත දොඩවමින් කොම්පැනිකරුවන් අස්වැද්දීමට දේශපාලන මැරයෝ වලිකති.

## ජාතික සම්පත් විකුණන් කෑම

වැඩ බැරි මිනිස්සු අපේ ගම්වල ද සිටිති. ජීවිකා වෘත්තියක් කර ගන්නට දැනුමක් හෝ බුද්ධියක් නොමැති ඔවුහු අහල පහළ අයගෙන් යමක් ඉල්ලාගෙන යැපෙති. කලක් ගත වන කල පිනට දෙන්නෝ ද මග හරිති. එවිට වැඩ බැරි උන්ට සිදු වන්නේ ගෙදර දොරේ තියෙන දෙයක් විකුණාගෙන කන්නට ය. අවසානයේ තම පරම්පරාවේ භුක්තිය සඳහා ඇති වටිනා දේ ද විකුණා කන ඔවුහු තම පවුලේ ඉදිරි පරම්පරාව ද නිගමනට ඇද දමති.

රටේ වරින් වර බලයට ආ යූඇන්පී ආණ්ඩුත් හරියට ම ඒ වගේ ය. 1977 න් පටන් ගෙන දාහත් වසරක් එක දිගට ආණ්ඩු කළ එක්සත් ජාතික පක්ෂයේ වැඩ බැරි නායකයන්ට රටේ ආර්ථිකය සංවර්ධනය කිරීම පිළිබඳ මළ පොතේ අකුරක දැනුමක් නොතිබූ බව පැහැදිලි ය. ඔවුන් දැන සිටි එකම අර්ථ ශාස්ත්‍රය නම් ණයට ඉල්ලන් කෑම හා විකුණන් කෑම ය.

එසේ වුවත් ගමේ වැඩ බැරි එකාත් යූඇන්පී ආණ්ඩුත් අතර බරපතළ වෙනසක් ද තිබේ. ගමේ වැඩ බැරි එකා විකුණන් කන්නේ ඌට අයිති දේපළ ය. එහෙත් යූඇන්පී ආණ්ඩු වික්කේ රටේ ජනතාවට අයිති, ජාතික දේපළ ය. එකී දාහත් වසර තුළ ජේ ආර්, ප්‍රේමදාස, රනිල් තුන් කට්ටුව මේ රටේ වටිනා රාජ්‍ය ආයතන, කර්මාන්ත හා දේපළ හතළිහකට වැඩි සංඛ්‍යාවක් තම ගජ මිතුරන්ටත් විදේශිකයන්ටත් කුණු කොල්ලයට විකුණා දැමූහ. මේ ජාවාරමේදී ජාතික සම්පත් විකුණා දැමුණේ රජයේ තක්සේරුකරුගේ තක්සේරුව තුට්ටුවකට ගණන් නොගෙන ය. ජාවාරමෙන් රාජ්‍ය භාණ්ඩාගාරයට අහිමි කළ මුදල, එකල රුපියලේ වටිනාකමට අනුව රුපියල් බිලියන හැට ඉක්මවයි. මේ දැවැන්ත ධනස්කන්ධය යටිමඩි ගැසුවා යයි කියනු හැර වෙන කුමක් කියන්න ද?

යහ පාලන එකමුතු ආණ්ඩුවත් යන්නේ ඒ පාරේ ම ය. එකමුතු යයි කීවාට රටේ ආර්ථිකය ගසාකන්නේ යූඇන්පී කරයන් පිරිසක් තනියෙනි. යූඇන්පියේ ඒ පව්කාරකම්වලට කරගසන්නට ශ්‍රීලනිප කාලකණ්ණි ඇම්බැට්ටයන් පිරිසක් ද මෙවර සිටිති. චන්ද්‍රිකාට හැර ශ්‍රීලනිපයේ නායකයන් කාටවත් රාජ්‍ය දේපළ විකුණන් කෑමේ පුරුද්දක් තිබුණේ නැත. මහින්ද බලයට ආ විට රනිල්ලා චන්ද්‍රිකාලා විකුණා දමා තිබුණු රාජ්‍ය ආයතන කීපයක් අපසු රජයට පවරාගන්නට ද කටයුතු කළ බව අමතක නොකළ යුතු ය.

යටිමඩි ගැහිල්ලේ රස හොඳින්ම හඳුනන යූඇන්පීකාරයන් මේ වන විට රාජ්‍ය දේපළ විකුණන්නට සොයමින් දුවඇවිදින්නේ පිස්සු වැටුණු බල්ලන් පිරිසක් මෙනි. මේ, හම්බන්තොටින් - ත්‍රිකුණාමලෙන් නතර වන ගමනක් නො වේ. මේ වන විට පන්සලේ පිං පෙට්ටියට ද අත දමා අවසාන ය!

**වැඩබිම ජන බලය**

කොළඹ 10, ස්ටාර් මුද්‍රණාලයේ දී මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදී